සැ. යු.-2015.10.30 දින පළ වූ අංක 1939 දරන ගැසට් පත්‍රයේ iv (අ) කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,940 - 2015 නොවැම්බර් මස 06 වැනි සිකුරාදා - 2015.11.06

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIඅ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)

| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු - ඇබෑර්තු ... ... ... ... | 1896 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 1902 |

සැ.යු .- ශ්‍රී ලංකා සේවා පිරිස් කළමනාකරණ ආයතනය (සංශෝධන) පනත් කෙටුම්පත සහ 2016 මුදල් වර්ෂය සඳහා විසර්ජන පනත් කෙටුම්පත 2015 ඔක්තෝබර් මස 09 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයන් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2015 නොවැම්බර් මස 27 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2015 නොවැම්බර් මස 13 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*''යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**ඩබ්ලිව්. ඒ. ඒ. ජී. ෆොන්සේකා,**
රජයේ මුද්‍රණාලයාධිපති. (වැ. බ.).

2015 ජනවාරි මස 22 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents. gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

1893- B 80999—5,402 (2015/11)
B1-

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

**අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :**

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

**2. සේවා කොන්දේසි - සාමාන්‍ය :**

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකි ය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

**3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි**

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරිහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අනිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමඟම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

**4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි**

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

**5. යුද්ධ සේවා අනුග්‍රහය**

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත භටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

**6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු**

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම**

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

**8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය**

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

# විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකිය :-

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම,
(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම,
(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම,
(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාගශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. :—

(i) විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii) යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාගශාලාධිපතීන්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක වක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කූඩු, මකන, රෙදි කෑලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii) යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

**විභාග කොමසාරිස් ජනරාල්.**

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

# තනතුරු — ඇබෑර්තු

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු ගාල්ල දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවලට අදළ මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

01. ඉල්ලුම්කරුවන් අදාළ මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැළකිල්ල ලබන අය ද විය යුතු ය.

02. මෙම තනතුර සඳහා මුස්ලිම් පුරුෂ පක්‍ෂයට පමණක් ඉල්ලුම් කළ හැකි ය.

03. ඉල්ලුම්කරුවන් වයස අවුරුදු 30 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 60 ට නොවැඩි විය යුතු ය.

04. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතු ය.

05. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකි ය.

06. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් රෙජිස්ට්‍රාර් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත හැක.

07. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2015 දෙසැම්බර් මස 07 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2015 ඔක්තෝබර් මස 20 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/A3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

#### උපලේඛනය

| දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර | ඉල්ලුම්පත් යැවිය යුතු ලිපිනය |
|---|---|---|---|
| ගාල්ල | ගාල්ල කඩවත් සතර | ගාල්ල දිස්ත්‍රික් කොට්ඨාසයේ ගිංතොට ප්‍රදේශයේ මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ගාල්ල. |

11-105

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු — නුවරඑළිය දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

01. ඉල්ලුම්කරුවන් අදාළ උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැලකිල්ල ලබන අය ද විය යුතු ය.

02. මෙම තනතුර සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්‍ෂයටම ඉල්ලුම් කළ හැකි ය.

03. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 30ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 60ට නොවැඩි විය යුතු ය.

04. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතු ය.

05. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකි ය.

06. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් රෙජිස්ට්‍රාර් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත හැකි ය.

07. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2015 දෙසැම්බර් මස 07 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2015 ඔක්තෝබර් මස 20 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/A3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

#### උපලේඛනය

| දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර | ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය |
|---|---|---|---|
| නුවරඑළිය | වලපනේ | වලපනේ (ඔයපලාත) කොට්ඨාසයේ අතිරේක විවාහ (උඩරට/සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, නුවරඑළිය. |

11-104

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු — ගම්පහ දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

01. ඉල්ලුම්කරුවන් අදාළ උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැළකිල්ල ලබන අය ද විය යුතු ය.

02. මෙම තනතුර සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයටම ඉල්ලුම් කළ හැකි ය.

03. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 30ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 60ට නොවැඩි විය යුතු ය.

04. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතු ය.

05. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකි ය.

06. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් රෙජිස්ට්‍රාර් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත හැකි ය.

07. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2015 දෙසැම්බර් මස 07 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2015 ඔක්තෝබර් මස 20 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/A3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

#### උපලේඛනය

| දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර | ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය |
|---|---|---|---|
| ගම්පහ | අත්තනගල්ල | බටහිර සියනෑ කෝරළය කොට්ඨාසයේ බෙම්මුල්ල හා මගලේගොඩ ප්‍රදේශයේ අතිරේක විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ගම්පහ. |

11-103

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු — කොළඹ දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

01. ඉල්ලුම්කරුවන් අදාළ උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැළකිල්ල ලබන අය ද විය යුතු ය.

02. මෙම තනතුර සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයටම ඉල්ලුම් කළ හැකි ය.

03. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 30ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 60ට නොවැඩි විය යුතු ය.

04. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතු ය.

05. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකි ය.

06. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් රෙජිස්ට්‍රාර් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත හැකි ය.

07. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2015 දෙසැම්බර් මස 07 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2015 ඔක්තෝබර් මස 20 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/A3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

#### උපලේඛනය

| දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර | ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය |
|---|---|---|---|
| කොළඹ | තිඹිරිගස්යාය | තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය කොට්ඨාසයේ උප්පැන්න හා මරණ (දෙමළ මාධ්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, කොළඹ |
| කොළඹ | තිඹිරිගස්යාය | කොල්ලුපිටිය කොට්ඨාසයේ උප්පැන්න | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් |

| දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර | ඉල්ලුම්පත් යැවිය යුතු ලිපිනය |
|---|---|---|---|
| | | හා මරණ රෙජිස්ට්‍රාර් ධුරය | ලේකම් කාර්යාලය, කොළඹ |
| කොළඹ | තිඹිරිගස්යාය | හැව්ලොක් ටවුන් කොට්ඨාසයේ අතිරේක විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, කොළඹ |
| කොළඹ | කොළඹ | අලුත්කඩේ කොට්ඨාසයේ විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, කොළඹ |
| කොළඹ | කොළඹ | අලුත්කඩේ කොට්ඨාසයේ උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, කොළඹ |

11-102

---

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු හම්බන්තොට දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවලට අදාල මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

01. ඉල්ලුම්කරුවන් අදාළ මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැළකිල්ල ලබන අය ද විය යුතු ය.

02. මෙම තනතුර සඳහා මුස්ලිම් පුරුෂ පක්‍ෂයට පමණක් ඉල්ලුම් කළ හැකිය.

03. ඉල්ලුම්කරුවන් වයස අවුරුදු 30 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 60 ට නොවැඩි විය යුතු ය.

04. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතු ය.

05. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකිය.

06. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් රෙජිස්ට්‍රාර් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත හැක.

07. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2015 දෙසැම්බර් මස 07 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2015 ඔක්තෝබර් මස 15 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/ඒ3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

### උපලේඛනය

| දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර | ඉල්ලුම්පත් යැවිය යුතු ලිපිනය |
|---|---|---|---|
| හම්බන්තොට | හම්බන්තොට | බඳගිරිය කොට්ඨාසයේ මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර්ධුරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, හම්බන්තොට. |

11-32

---

## රාජ්‍ය සේවා කොමිෂන් සභාව

### මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ (ජෛව විවිධත්ව) තනතුර සඳහා බඳවා ගැනීම

ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ II පන්තියේ නියෝජ්‍ය අධ්‍යක්ෂ (ජෛව විවිධත්ව) තනතුර සඳහා පහත සඳහන් සුදුසුකම් ඇති ශ්‍රී ලාංකිකයන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. *අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්* .- සෑම අයදුම්කරුවෙකුම පහත සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතුයි.

(i) පිළිගත් විශ්වවිද්‍යාලයකින් පහත සඳහන් ක්ෂේත්‍රයන්ගෙන් ලබාගත් විශේෂ උපාධියක් තිබීම, උද්භිද විද්‍යාව, ජීව විද්‍යාව, සත්ත්ව විද්‍යාව, රසායන විද්‍යාව, භෞතික විද්‍යාව, පරිසර කළමනාකරණය, පරිසර ඉංජිනේරු විද්‍යාව, කෘෂිකර්මය ; සහ

(ii) ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ II පන්තියේ නිලධාරියෙකු වීම ; සහ

(iii) අයදුම්පත් කැඳවීමේ අවසාන දිනට පූර්වාසන්න පස් අවුරුදු සතුටුදායක සේවා කාලයක් සපුරා තිබීම. (සතුටුදායක සේවාකාලය යනුවෙන් අදහස් කරනු ලබන්නේ අදාළ කාලය තුළ සියලු වැටුප් වර්ධක උපයා ගෙන ඇත්තා වූ ද, එම කාලය තුළ සිදු කරනු ලැබූ වරදක් සම්බන්ධයෙන් අවවාද කිරීමක් හැර වෙනත් විනය දඬුවමක් ලබා නොමැති වූ ද සේවා කාලයකි.)

02. *වැටුප් ක්‍රමය* .- රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 06/2006හි එස්එල් 1-2006 අනුව රු. 22,935 - 10 x 645 - 8 x 790 - 17 x 1,050 - රු. 53,555 (III, II, I ශ්‍රේණි සඳහා අදාළ වේ.) නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුර සඳහා රු. 30,175 සිට රු. 35,705 දක්වා වැටුප් අදාළ වේ.

03. *බඳවා ගැනීමේ ක්‍රමය* .- ඉහත සුදුසුකම් සහිත ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලැබූ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත අපේක්ෂකයින් තෝරා ගැනීම සිදු කෙරෙන අතර, එහිදී රාජ්‍ය සේවා කොමිෂන් සභාව මගින් අනුමත කරන ලද පහත ලකුණු දීමේ ක්‍රමය පදනම් කරගනු ලැබේ.

(i) අතිරේක අධ්‍යාපන සුදුසුකම් — උපරිම ලකුණු 25
පශ්චාත් උපාධි ඩිප්ලෝමා — ලකුණු 15
පශ්චාත් උපාධිය — ලකුණු 20
ආචාර්ය උපාධිය — ලකුණු 25

(ii) සේවා පළපුරුද්ද (වසර 10ට වැඩි සේවා කාලය සඳහා එක් වසරකට ලකුණු 03 බැගින්) — උපරිම ලකුණු 30

(iii) පහත සඳහන් අවශ්‍යතා සපුරා ඇති පර්යේෂණ හා ප්‍රකාශන සඳහා (එකකට ලකුණු 04 බැගින්) — උපරිම ලකුණු 20

(අ) අදාළ ප්‍රකාශනය වචන 2,000කට වැඩිවිය යුතුයි.

(ආ) අදාළ පර්යේෂණ හා ප්‍රකාශන ස්වභාවික සම්පත් ක්ෂේත්‍රයේ හෝ බඳවාගැනීමේ පරිපාටියේ 7.2.2.1 ඡේදයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ (ජෛව විවිධත්ව) තනතුර සඳහා අදාළ සුදුසුකම් ලෙස නියමකර ඇති ක්ෂේත්‍රයක විය යුතුයි.

(ඇ) ලකුණු 04 ලබා දෙන්නේ තනි පුද්ගලයකු විසින් කරන ලද පර්යේෂණ හා ප්‍රකාශන සඳහා පමණක් වන අතර, කණ්ඩායමක් වශයෙන් සම්පූර්ණ කර ඇති එක් පර්යේෂණයකට හා ප්‍රකාශනයකට හිමි වන්නේ ලකුණු 02ක් පමණි.

(iv) භාෂා ප්‍රවීණතාවය — උපරිම ලකුණු 10
ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව (වසරකට හෝ ඊට වැඩි) — ලකුණු 10
ඉංග්‍රීසි භාෂාව පිළිබඳ 06 මසක ඩිප්ලෝමාවක් හෝ සහතික පත්‍ර පාඨමාලාව — ලකුණු 05

(v) තොරතුරු තාක්ෂණ කුසලතාවය — උපරිම ලකුණු 10
තොරතුරු තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා — ලකුණු 10
තොරතුරු තාක්ෂණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාවක් සඳහා — ලකුණු 05

(v) සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන කුසලතාවය — උපරිම ලකුණු 05

04. සේවා කොන්දේසි :

(i) මෙම තනතුර ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු අනත්දරු/ වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතුය.

(ii) ආයතන සංග්‍රහයේ II වැනි පරිච්ඡේදයේ 10 සිට 12 දක්වා වගන්තිවල විධිවිධාන අදාළ වේ.

05. මේ සමග ඇති ආදර්ශ ආකෘති පත්‍රය අනුව සකස් කරන ලද ජීව දත්ත තොරතුරු දැක්වෙන අයදුම්පත් ලියාපදිංචි තැපෑලෙන් 2015.12.07 දිනට පෙර ලැබෙන සේ, ලේකම්, මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය, සම්පත්පාය, අංක 82, රජමල්වත්ත පාර, බත්තරමුල්ල යන ලිපිනයට එවිය යුතු. එම ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ "නියෝජ්‍ය අධ්‍යක්ෂ (ජෛව විවිධත්ව)" ලෙස පැහැදිලිව සඳහන් කළ යුතු ය.

ඔබ විසින් එවන ලද අයදුම්පතේ සඳහන් කර ඇත්තා වූ යම් අසත්‍ය තොරතුරක් බඳවාගැනීමට පෙර අනාවරණය වුවහොත් අයදුම්කරුගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. එබඳු අසත්‍ය තොරතුරක් බඳවාගැනීමෙන් පසු අනාවරණය වුවහොත් සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගය පරිදි,

ලේකම්,
මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය.

2015 ඔක්තෝබර් මස 19 වැනි දින,
මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය,
සම්පත්පාය, අංක 82, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

**ආදර්ශ අයදුම් පත්‍රය**

*මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය*

නියෝජ්‍ය අධ්‍යක්ෂ (ජෛව විවිධත්ව) තනතුර සඳහා අයදුම්පත්‍රය

කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණයි

(අ කොටස)

01. (i) නම (මුලකුරු සමග) සිංහල භාෂාවෙන් හෝ දෙමළ භාෂාවෙන් :————. මයා/මිය/මෙනවිය
(ii) නම (මුලකුරු සමග) ඉංග්‍රීසි භාෂාවෙන් (Mr/Miss/Mrs.) :————.
(iii) මුලකුරුවලින් හැඳින්වෙන නම් (සිංහල භාෂාවෙන් හෝ දෙමළ භාෂාවෙන්) :————.
(iv) (ඉංග්‍රීසි භාෂාවෙන්) :————.

02. ලිපිනය :

(i) පුද්ගලික :————.
(ii) කාර්යාලීය :————.

03. ජාතික හැඳුනුම්පත් අංකය :————.

04. උපන් දිනය : අවුරුද්ද :———. මාසය :———. දිනය :———.

05. 2015.12.07 දිනට වයස :

අවුරුදු :————. මාස :————. දින :————.

06. ජාතිය :————.

07. විවාහක/අවිවාහක බව :————.

08. (අ) අධ්‍යාපන සුදුසුකම් ඃ
(i) උපාධි සුදුසුකම් ඃ

| උපාධිය | විෂයයන් | සාමාර්ථය සාමාන්‍ය/පන්තිය | වර්ෂය | විශ්වවිද්‍යාලය |
|---|---|---|---|---|
| | | | | |

09. සේවා පළපුරුද්ද :————.
(ආයතන ප්‍රධානියාගෙන් ලබා ගත් සේවා සහතිකයක් ඇමිණිය යුතු ය.)

10. වෙනත් සුදුසුකම් :————.

11. මීට පෙර රජයේ දෙපාර්තමේන්තුවක/සංස්ථාවක සේවයේ නිරතව සිටියේ නම් අස්වීමට හේතුව :————.

12. සාපරාධී වරදකට අධිකරණයකින් වරදකරු වී ඇත්නම් එම වරද හා ලද දඬුවම් පිළිබඳ විස්තර :————.

13. මෙම අයදුම්පත්‍රයේ මවිසින් සඳහන් කර ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බව සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරුවලින් කිසිවක් අසත්‍ය හෝ වැරදි බව හෝ මා තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මෙම තනතුර සඳහා මා නුසුදුස්සකු වන බවත්, තෝරා ගැනීමෙන් පසුව අනාවරණය වුවහොත් කිසිම වන්දියක් නොමැතිව සේවයෙන් පහ කිරීමට යටත් වන බවත් මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන

දිනය :————.

(ආ කොටස)

(රාජ්‍ය/පළාත් සභා/ආයතන ප්‍රධානියාගේ නිර්දේශය)

මෙම අයදුම්පත ඉදිරිපත් කරන ..........................................මයා/මිය/මෙනවිය .............................. දෙපාර්තමේන්තුවේ/අමාත්‍යාංශයේ/පළාත් සභාවේ ........................................... වශයෙන් සේවය කරන බවත්, ඉහත දක්වා ඇති විස්තර නිවැරදි බවත්, ඔහුගේ/ඇයගේ වැඩ, පැමිණීම හා හැසිරීම සතුටුදායක බවත්, සහතික කරමි. ඔහු/ඇය මෙම තනතුර සඳහා තෝරා ගතහොත් සේවයෙන් නිදහස් කළ හැකි ය/නොහැකි ය.

————,
ආයතන ප්‍රධානියාගේ/බලයලත්
නිලධාරියාගේ අත්සහ හා නිල මුද්‍රාව.

නම :————.
තනතුර :————.
ලිපිනය :————.

11 - 196

**රාජ්‍ය සේවා කොමිෂන් සභාව**

මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ (තිරසර සංවර්ධන) තනතුර සඳහා බඳවාගැනීම

ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ I පන්තියේ අධ්‍යක්ෂ (තිරසර සංවර්ධන) තනතුර සඳහා පහත සඳහන් සුදුසුකම් ඇති ශ්‍රී ලාංකිකයන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. *අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්* .- සෑම අයදුම්කරුවෙකු ම පහත සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතුයි. ඃ-

(i) පිළිගත් විශ්ව විද්‍යාලයකින් පහත සඳහන් ක්ෂේත්‍රයන්ගෙන් ලබාගත් විශේෂ උපාධියක් තිබීම, උද්භිද විද්‍යාව, සත්ත්ව විද්‍යාව, පරිසර කළමනාකරණය, පරිසර ඉංජිනේරු විද්‍යාව, වන විද්‍යාව කෘෂිකර්මය ; පාරිසරික කෘෂිකර්මය, පාරිසරික ආර්ථික විද්‍යාව;

සහ

(ii) මීට අතිරේකව ඉහත ක්ෂේත්‍රයක පශ්චාත් උපාධියක් ලබා තිබීම ; සහ

(iii) ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ I ශ්‍රේණියේ නිලධාරියකු වීම ; සහ

(iv) අයදුම්පත් කැඳවීමේ අවසාන දිනට පූර්වාසන්න පස් අවුරුදු සතුටුදායක සේවා කාලයක් සපුරා තිබීම. (සතුටුදායක සේවාකාලය යනුවෙන් අදහස් කරනු ලබන්නේ අදාළ කාලය තුළ සියලු වැටුප් වර්ධක උපයා ගෙන ඇත්තා වූ ද, එම කාලය තුළ සිදු කරනු ලැබූ වරදක් සම්බන්ධයෙන් අවවාද කිරීමක් හැර වෙනත් විනය දඬුවමක් ලබා නොමැති වූ ද සේවා කාලයකි.)

02. *වැටුප් ක්‍රමය* .- රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 06/2006හි එස් එල් 1-2006 අනුව රු. 22,935 - 10 x 645 - 8 x 790 - 17 x 1,050 - රු. 53,555 (III, II, I ශ්‍රේණි සඳහා අදාළ වේ.) නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුර සඳහා රු. 36,755 සිට රු. 53,555 දක්වා වැටුප් අදාළ වේ.

03. *බඳවා ගැනීමේ ක්‍රමය* .- ඉහත සුදුසුකම් සහිත ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලැබූ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත අපේක්ෂකයින් තෝරා ගැනීම සිදු කෙරෙන අතර, එහි දී රාජ්‍ය සේවා කොමිෂන් සභාව මගින් අනුමත කරන ලද පහත ලකුණු දීමේ ක්‍රමය පදනම් කරගනු ලැබේ :—

(i) අතිරේක අධ්‍යාපන සුදුසුකම් — උපරිම ලකුණු 10
අවාර්ය උපාධිය — ලකුණු 10
පශ්චාත් උපාධිය — ලකුණු 05
පශ්චාත් උපාධි ඩිප්ලෝමාව — ලකුණු 03
(මූලික සුදුසුකම්වලට අතිරේකව ලබාගෙන ඇති, විෂය ක්ෂේත්‍රයට අදාළ වන)

(ii) සේවා පළපුරුද්ද — උපරිම ලකුණු 45
(ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවය I ශ්‍රේණියේ සේවා කාලය සඳහා එක් වසරකට ලකුණු 05 බැගින්)

(iii) පහත සඳහන් අවශ්‍යතා සපුරා ඇති පර්යේෂණ හා ප්‍රකාශන සඳහා — උපරිම ලකුණු 20
(එකකට ලකුණු 04 බැගින්)

(අ) අදාළ ප්‍රකාශනය වචන 2,000ට වැඩිවිය යුතුයි.

(ආ) අදාළ පර්යේෂණ හා ප්‍රකාශන ස්වභාවික සම්පත් ක්ෂේත්‍රයේ හෝ බඳවාගැනීමේ පරිපාටියේ 10.2.1.1 ඡේදයේ I වගන්තියේ සඳහන් කර ඇති විෂයය ක්ෂේත්‍රයක විය යුතුයි.

(ඇ) ලකුණු 04 ලබා දෙන්නේ තනි පුද්ගලයකු විසින් කරන ලද පර්යේෂණ හා ප්‍රකාශන සඳහා පමණක් වන අතර, කණ්ඩායමක් වශයෙන් සම්පූර්ණ කර ඇති එක් පර්යේෂණයකට හා ප්‍රකාශනයකට හිමි වන්නේ ලකුණු 02ක් පමණි.

(iv) භාෂා ප්‍රවීණතාවය — උපරිම ලකුණු 10

ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව (වසරකට හෝ ඊට වැඩි) — ලකුණු 10

ඉංග්‍රීසි භාෂාව පිළිබඳ 06 මසක ඩිප්ලෝමාවක් හෝ සහතික පත්‍ර පාඨමාලාව — ලකුණු 05

(v) තොරතුරු තාක්ෂණ කුසලතාවය — උපරිම ලකුණු 10

තොරතුරු තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා — ලකුණු 10

තොරතුරු තාක්ෂණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාවක් සඳහා — ලකුණු 05

(v) සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන කුසලතාවය — උපරිම ලකුණු 05

04. සේවා කොන්දේසි :

(i) මෙම තනතුර ස්ථිර ය, විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු අනත්දරු/ වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතු ය.

(ii) ආයතන සංග්‍රහයේ II වැනි පරිච්ඡේදයේ 10 සිට 12 දක්වා වගන්තිවල විධිවිධාන අදාළ වේ.

05. මේ සමග ඇති ආදර්ශ ආකෘති පත්‍රය අනුව සකස් කරන ලද ජීව දත්ත තොරතුරු දැක්වෙන අයදුම්පත් ලියාපදිංචි තැපෑලෙන් 2015.12.07 දිනට පෙර ලැබෙන සේ, ලේකම්, මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය, සම්පත්පාය, අංක 82, රජමල්වත්ත පාර, බත්තරමුල්ල යන ලිපියනයට එවිය යුතුය. එම ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ "අධ්‍යක්ෂ (තිරසර සංවර්ධන)" ලෙස පැහැදිලිව සඳහන් කළ යුතු ය.

ඔබ විසින් එවන ලද අයදුම්පතේ සඳහන් කර ඇත්තා වූ යම් අසත්‍ය තොරතුරක් බඳවාගැනීමට පෙර අනාවරණය වුවහොත් අයදුම්කරුගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. එබඳු අසත්‍ය තොරතුරක් බඳවාගැනීමෙන් පසු අනාවරණය වුවහොත් සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගය පරිදි,

ලේකම්,
මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය

2015 ඔක්තෝබර් මස 19 වැනි දින,
මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය,
සම්පත්පාය, අංක 82, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

## ආදර්ශ අයදුම් පත්‍රය

මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය

අධ්‍යක්ෂ (තිරසර සංවර්ධන) තනතුර සඳහා අයදුම්පත්‍රය

කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණයි ☐

(අ කොටස)

01. (i) නම (මුලකුරු සමග) සිංහල භාෂාවෙන් හෝ දෙමළ භාෂාවෙන් :———. මයා/මිය/මෙනවිය
(ii) නම (මුලකුරු සමග) ඉංග්‍රීසි භාෂාවෙන් (Mr/Miss/Mrs.) :———.
(iii) මුලකුරුවලින් හැඳින්වෙන නම් (සිංහල භාෂාවෙන් හෝ දෙමළ භාෂාවෙන්) :———.
(iv) (ඉංග්‍රීසි භාෂාවෙන්) :———.

02. ලිපිනය :

(i) පුද්ගලික :———.
(ii) කාර්යාලීය :———.

03. ජාතික හැඳුනුම්පත් අංකය :———.

04. උපන් දිනය : අවුරුද්ද :———. මාසය :———. දිනය :———.

05. 2015.11.07 දිනට වයස :

අවුරුදු :———. මාස :———. දින :———.

06. ජාතිය :———.

07. විවාහක/අවිවාහක බව :———.

08. (අ) අධ්‍යාපන සුදුසුකම් :

(i) උපාධි සුදුසුකම් :

| උපාධිය | විෂයයන් | සාමාර්ථය සාමාන්‍ය/පන්තිය | වර්ෂය | විශ්වවිද්‍යාලය |
|---|---|---|---|---|
| | | | | |

(ii) පශ්චාත් උපාධි සුදුසුකම් :

| පශ්චාත් උපාධියේ නම | උපාධිය පිරිනමන ලද වර්ෂය | විශ්වවිද්‍යාලය |
|---|---|---|
| | | |

09. සේවා පළපුරුද්ද :———.
(ආයතන ප්‍රධානියාගෙන් ලබා ගත් සේවා සහතිකයක් ඇමිණිය යුතු ය.)

10. වෙනත් සුදුසුකම් :————.

11. මීට පෙර රජයේ දෙපාර්තමේන්තුවක/සංස්ථාවක සේවයේ නිරතව සිටියේ නම් අස්වීමට හේතුව :————.

12. සාපරාධී වරදකට අධිකරණයකින් වරදකරු වී ඇත්නම් එම වරද හා ලද දඬුවම් පිළිබඳ විස්තර :————.

13. මෙම අයදුම්පත්‍රයේ මවිසින් සඳහන් කර ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බව සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරුවලින් කිසිවක් අසත්‍ය හෝ වැරදි බව හෝ මා තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මෙම තනතුර සඳහා මා නුසුදුස්සකු වන බවත්, තෝරා ගැනීමෙන් පසුව අනාවරණය වුවහොත් කිසිම වන්දියක් නොමැතිව සේවයෙන් පහ කිරීමට යටත් වන බවත් මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

(ආ කොටස)

*(රාජ්‍ය/පළාත් සභා/ආයතන ප්‍රධානියාගේ නිර්දේශය)*

මෙම අයදුම්පත ඉදිරිපත් කරන ..........................................මයා/මිය/මෙනවිය .............................. දෙපාර්තමේන්තුවේ/අමාත්‍යාංශයේ/පළාත් සභාවේ ........................................... වශයෙන් සේවය කරන බවත්, ඉහත දක්වා ඇති විස්තර නිවැරදි බවත්, ඔහුගේ/ඇයගේ වැඩ, පැමිණීම හා හැසිරීම සතුටුදායක බවත්, සහතික කරමි. ඔහු/ඇය මෙම තනතුර සඳහා තෝරා ගතහොත් සේවයෙන් නිදහස් කළ හැකිය/නොහැකිය.

————,
ආයතන ප්‍රධානියාගේ/බලයලත්
නිලධාරියාගේ අත්සන හා නිල මුද්‍රාව.

නම :————.
තනතුර :————.
ලිපිනය :————.

11 - 197

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

**මහා නගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය**

ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව

ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර (තාක්ෂණ) සේවා ගණයේ පරීක්ෂක, පුහුණු ශ්‍රේණිය (ශ්‍රී. ලං.තා. සේ.) හා සැලසුම් ශිල්පී, පුහුණු ශ්‍රේණිය (ශ්‍රී. ලං. තා. සේ.) සඳහා බඳවා ගැනීමේ සීමිත තරඟ විභාගය - 2015

1.0 ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුවේ ඉහත සඳහන් තනතුරු පුරප්පාඩු පිරවීම සඳහා සුදුස්සන් තෝරා ගැනීමේ සීමිත තරඟ විභාගය සඳහා මෙම නිවේදනයේ දක්වා ඇති අවම සුදුසුකම් සපුරා ඇති ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් ජාතික භෞතික සැලසුම් අධ්‍යක්ෂ ජනරාල් විසින් අයදුම්පත් කැඳවනු ලැබේ.

2.0 මෙම නිවේදනය අවසානයේ දක්වා ඇති ආදර්ශ ආකෘතියට අනුව A4 කඩදාසියේ දෙපැත්ත භාවිතා කරමින් පිළියෙල කරන ලද අයදුම්පත්‍රයක් 2015 නොවැම්බර් 30 වැනි දිනට හෝ එදිනට ප්‍රථම ''අධ්‍යක්ෂ ජනරාල්, ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය, 28/10, මලලසේකර මාවත, කොළඹ 07'' යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරෙහි ''ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ පරීක්ෂක, පුහුණු ශ්‍රේණිය තනතුරට බඳවා ගැනීමේ සීමිත තරඟ විභාගය'' හෝ ''ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ සැලසුම් ශිල්පී, පුහුණු ශ්‍රේණිය තනතුරට බඳවා ගැනීමේ සීමිත තරඟ විභාගය'' යනුවෙන් උචිත පරිදි පැහැදිලිව සටහන් කළ යුතුය. ප්‍රමාද වී ලැබෙන, අපැහැදිලි හා අසම්පූර්ණ අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

3.0 සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :

3.1 මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු අනත්දරු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය.

3.2 රාජ්‍ය සේවයේ පත්වීම් සම්බන්ධයෙන් වන ආයතන සංග්‍රහයේ II පරිච්ඡේදයේ 10-12 දක්වා වගන්ති ද කාර්ය පටිපාටික රීති ද අදාළ වේ.

3.3 තෝරා ගනු ලබන අයදුම්කරුවන් ආයතන සංග්‍රහයේ විධිවිධානවලට ද, මුදල් රෙගුලාසිවලට ද, දෙපාර්තමේන්තු නියෝගවලට ද, කලින් කල රජය විසින් නිකුත් කරනු ලබන වෙනත් රෙගුලාසි හා නියෝගවලට ද යටත් විය යුතුය.

4.0 අවශ්‍ය අධ්‍යාපන සුදුසුකම් :

4.1 සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, විද්‍යාව, ගණිතය යන විෂයයන්ට සම්මාන සාමාර්ථයන් සහිතව දෙවරකට නොවැඩි වාර ගණනක දී අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය විෂයන් හයකින් (06) සමත්ව තිබීම.

5.0 *පළපුරුද්ද :*
ප්‍රාථමික හෝ ඉන් ඉහළ සේවා ගණයක ස්ථිර, දෙපාර්තමේන්තුගත තනතුරක අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 10ක සක්‍රීය හා සතුටුදායක සේවා පළපුරුද්දක් තිබීම;

06. *කායික සුදුසුකම් :*
සෑම අපේක්ෂකයකුම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

07. *වෙනත් සුදුසුකම් :*

7.1 දැනට දරන තනතුරෙහි පත්වීම ස්ථිර කර තිබිය යුතුයි.

7.2 නියමිත දිනට පූර්වාසන්නව රාජ්‍ය සේවයේ ස්ථිර දෙපාර්තමේන්තුගත තනතුරක යටත් පිරිසෙයින් වසර 5ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතු අතර, ඒ බව දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් සහතික කර තිබීම.

7.3 සේවයට බඳවා ගැනීම සඳහා වන ලිඛිත පරීක්ෂණයට පෙනී සිටීම සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති ලෙසට පිළිගනු ලබන්නේ නිලධාරියා සියලු සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් කරනු ලබන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබෙන්නේ නම් පමණි.

08. *වයස :*
අදාළ නොවේ.

09. තෝරා ගැනීමේ පදනම :

9.1 *ලිඛිත තරග විභාගයේ කොන්දේසි :*
මේ සඳහා වන ලිඛිත විභාගය ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව වෙනුවෙන් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් මගින් පවත්වනු ලබන අතර, ඔහු විසින් දැනුම් දෙනු ලබන දිනක දී විභාගය පැවැත්වෙනු ඇත. ඔහු විසින් පනවනු ලබන නීති රීතිවලට විභාග අපේක්ෂකයින් යටත් විය යුතු වේ.

9.2 සුදුසුකම් සහිත අයදුම්කරුවන් ලිඛිත තරග විභාගයකට යොමු කරන අතර, සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටීම සඳහා එක් එක් ප්‍රශ්න පත්‍රයට අවම වශයෙන් 40% ක ලකුණු ප්‍රමාණයක් ලබා ගත යුතුය.

එම විභාගය සමත් අයදුම්කරුවන්ගේ මුළු ලකුණුවල කුසලතාවයේ අනුපිළිවෙල අනුව බඳවා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයකට භාජනය කර සුදුස්සන් තෝරා ගනු ලැබේ. සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු ලබා දෙනු නොලබන අතර, බඳවා ගැනීම් පරිපාටි හා ඊට අනුකූලව ප්‍රසිද්ධ කරනු ලබන නිවේදනයේ සුදුසුකම් සපුරා තිබේදැයි පරීක්ෂා කරනු ලැබේ.

9.3 ලිඛිත විභාගයට අදාළ විස්තර පහත පරිදි වේ :-

| *විෂයයන්* | *කාලය* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු ප්‍රමාණය* |
|---|---|---|---|
| 01. බුද්ධි පරීක්ෂණය | පැය 01කි | 100 | 40 |
| 02. විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය | පැය 03කි. | 100 | 40 |

| *විෂයයන්* | *විෂයය නිර්දේශය* |
|---|---|
| 01. බුද්ධි පරීක්ෂණය | අවබෝධ කර ගැනීමේ ශක්තිය, සිතීමේ තර්කානුකූලභාවය, විශ්ලේෂණ තත්ත්වය, ක්ෂණිකව නිවැරදි තීරණ ගැනීමේ හැකියාව, සංඛ්‍යානමය හා ගණිතමය ගැටළු විසඳීමේ හැකියාව, භාෂා ඛණ්ඩ, වගු, පිංතූර, ප්‍රස්ථාර උපයෝගී කර ගැනීම හා පරීක්ෂා කිරීම යනාදිය පිළිබඳ දැනුම පරීක්ෂා කෙරේ. (බහුවරණ ප්‍රශ්න 40ක් ඇතුළත් ප්‍රශ්න පත්‍රයකි. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු අපේක්ෂා කෙරේ.) |
| 02. විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය | පරීක්ෂක පුහුණු ශ්‍රේණිය<br>I කොටස<br>- මිනුම් හා මට්ටම් ගැනීම<br><br>දම්වැල් මැනුම, තියෝඩලයිට් මැනුම (ඉලෙක්ට්‍රොනික දුර මැනීමේ උපකරණ, EDM/Total Station) තලමිතික මැනුම, දම්වැල් හා කෝණ දෝෂ, සංක්‍රාන්ති තියෝඩලයිට්ටුවේ සීරුමාරුව, වර්ගඵලය ආගනනය, ඛණ්ඩාංක හා පස් වැඩ ගණනය කිරීම |

| විෂයයන් | විෂයය නිර්දේශය |
|---|---|
| | - මිනින්දෝරු මිනුම් උපකරණ ස්ථාපනය කිරීම<br>- කාර්ය පිහිටුවීම හා ඉඩම් කැබලි කිරීම<br>- ඩම්පි ලෙවලයේ සහ ඉංජිනේරු ලෙවලයේ සීරුමාරුව, මට්ටම් ගැනීමේ දෝෂ, මුහුදු මට්ටම, ආරම්භය හා ස්ථිර පිල් ලකුණු, සමෝච්ච රේඛා ලබා ගැනීම සඳහා උපකරණ භාවිතය හා උස නැග්ම හා බැස්ම ක්‍රමයෙන් මට්ටම් ගැනීම<br><br>II කොටස<br>- ගොඩනැගිලි ඉදි කිරීම<br>ගොඩනැගිලි අත්තිවාරම්, ගඩොල් වැඩ, බැමි වර්ග, කලු ගල් වැඩ, සිමෙන්ති ගල් හා කොන්ක්‍රීට් වැඩ, වැරගැන්වූ කොන්ක්‍රීට් වැඩ, ලී වැඩ, මූට්ටු වහල හා කාප්ප, පයිප්ප වැඩ, ජල අපවහනය හා ජලසම්පාදනය (ගොඩනැගිලි), ප්‍රමාණ පත්‍ර හා ඇස්තමේන්තු පිළියෙල කිරීම<br><br>**සැලසුම් ශිල්පී පුහුණු ශ්‍රේණිය**<br><br>මෙම ප්‍රශ්න පත්‍රය කොටස් 02කින් යුක්ත වන අතර, පළමු හෝ දෙවන කොටසට පමණක් පිළිතුරු බලාපොරොත්තු වේ.<br><br>I කොටස - සැලසුම් ශිල්පය<br><br>දෙන ලද සැලැස්මක් පරිමාණයට අනුව ඇඳීමේ පුවරු උපයෝගී කර ගෙන පහත අවශ්‍යතා සපිරෙන අයුරින් ඇඳිය යුතුය.<br><br>01. සැලැස්ම<br>02. ඉදිරි පෙනුම<br>03. පැති පෙනුම<br>04. දොර ජනෙල් විවරයන් පිළිබඳ විස්තර<br>05. දෙන ලද මාතෘකාවක් උපදෙස් පරිදි සටහන් කිරීම<br>දළ සැලැස්මක් පරිමාණයට අනුව වැඩි දියුණු කර ඇඳීමේ හැකියාව, නිර්මාණාත්මක කුසලතාවය (ත්‍රිමාන ආකෘති හා පර්යාවලෝකන ඇඳීම), සිද්ධාන්ත ප්‍රායෝගිකව යොද ගැනීමේ හැකියාව ආදිය අදළ වේ.<br><br>II කොටස - ප්‍රමාණ ගැනීම<br><br>දළ සැලැස්මක ප්‍රමාණ ගැනීමේ හැකියාව, සිද්ධාන්ත ප්‍රායෝගිකව යොද ගැනීමේ හැකියාව පිළිබඳ මූලික දැනුම හා දෙන ලද සැලැස්මක අත්තිවාරම් මට්ටම දක්වා විස්තරාත්මක ප්‍රමාණ ගැනීම. (මෙහිදී ශ්‍රී ලංකා සම්මත මිනුම් ක්‍රමයේ පිරිවිතරයන් පිළිබඳ නියමයන්ට අනුකූලවීම විශේෂ කුසලතාවයක් ලෙස සලකනු ලැබේ. අවශ්‍ය නම් ශ්‍රී ලංකා සම්මත මිනුම් ක්‍රමය ග්‍රන්ථය විභාගයේදී පරිශීලනය කළ හැක.) |

10. *බඳවා ගැනීම :*

ඉහත 4.0 සහ 5.0 යටතේ අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද ලබා ඇති ලිඛිත විභාගය සමත් අයදුම්කරුවන් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයකින් පසු ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ පරීක්ෂක පුහුණු කිරීමේ ශ්‍රේණියට (දෙවසරක) හා සැලසුම් ශිල්පී පුහුණු කිරීමේ ශ්‍රේණියට (දෙවසරක) බඳවා ගනු ලැබේ.

11. *වැටුප් පරිමාණය :*

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක : 6/2006 (iv) හි MN3-2006A යටතේ,
ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ පරීක්ෂක, පුහුණු කිරීමේ ශ්‍රේණිය
1 වසර - රු. 12,920
2 වසර - රු. 13,040
ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ සැලසුම් ශිල්පී, පුහුණු කිරීමේ ශ්‍රේණිය
1 වසර - රු. 12,920
2 වසර - රු. 13,040

12. *විභාග ගාස්තු :*

විභාග ගාස්තුව රු. 1,000 කි. අයදුම්කරුවන් විසින් ආපසු නොගෙවනු ලබන රු. 1,000 ක විභාග ගාස්තුවක් ශ්‍රී ලංකාව පුරා පිහිටි ඕනෑම තැපැල් කාර්යාලයක් මගින් (උප තැපැල් කාර්යාල හැර) ''SLIDA'' ගිණුම වෙත ගෙවිය යුතු අතර, ඒ ගෙවීමට අදළව ලබා දෙන රිසිට්පතේ අංකය විභාග අයදුම්පතේ අංක 12 යටතේ ඇතුළත් කළ යුතුයි.

අදළ තැපැල් කාර්යාලයේ දී ''SLIDA'' ගිණුම වෙත මුදල් ගෙවීමේ ඉල්ලුම්පත්‍රය පිරවීමේදී, මුදල් ලබා ගන්නා ලෙස ''SLIDA'' යන්නද මුදල් ලබාගන්නාගේ ලිපිනය යන ස්ථානයේ ඔබට අදළ විභාගයේ සංකේත නාමයද සටහන් කරන්න. (සංකේත නාමයන් පහත වගුවේ දක්වා ඇත.)

| | විභාගයේ නම | සංකේත නාමය |
|---|---|---|
| 01 | ශ්‍රී ලංකා තාක්‍ෂණ සේවයේ පරීක්‍ෂක, පුහුණු කිරීමේ ශ්‍රේණිය | SLTS (T) |
| 02 | ශ්‍රී ලංකා තාක්‍ෂණ සේවයේ සැලසුම් ශිල්පී, පුහුණු කිරීමේ ශ්‍රේණිය | SLTS (G) |

තව ද, ගිණුම වෙත මුදල් යවන්නා ලෙස අයදුම්කරුගේ නම ද, මුදල් යවන්නාගේ ලිපිනය යන ස්ථානයේ අයදුම්කරුගේ ජාතික හැඳුනුම්පත් අංකය ද, ඇතුලත් කර ඉල්ලුම් පත්‍රය සම්පූර්ණ කළ යුතුයි.

13. යම් අයදුම්කරුවෙකුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබීම හේතුවෙන් ඔහු/ඇය නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුවහොත් ඔහු/ඇය සේවයෙන් පහ කිරීමටත් කටයුතු කරනු ලැබේ.

14. *අත්සන සහතික කිරීම :*

අයදුම්කරුවන් තම ආදර්ශ අත්සන, රජයේ පාසල් ප්‍රධානියෙකු/විශ්‍රාමික ප්‍රධානියකු, කොට්ඨාසයේ ග්‍රාම නිලධාරිවරයෙකු, සාමදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතිඥවරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරිලත් නිලධාරියෙකු හෝ රු. 240,360 හෝ ඊට වැඩි හෝ වාර්ෂික වැටුපක් ලබන රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ හෝ ස්ථිර මාණ්ඩලික නිලධාරියෙකු හෝ නායක ස්වාමීන් වහන්සේ නමක් හෝ අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර පූජ්‍ය තත්වයේ සැලකිය යුතු තත්වයක් දරන අයකු ලවා සහතික කරවා ගත යුතුය. දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු අපේක්‍ෂකයන් සිය අයදුම්පත්‍රය ආයතන ප්‍රධානියා මඟින් එවිය යුතුය.

මෙහි සඳහන් නොවන කරුණක් සඳහා තීරණ ගැනීමේ බලධාරියා ජාතික භෞතික සැලසුම් අධ්‍යක්‍ෂ ජනරාල් වේ.

වෙරන්ජන් කුරුකුලසූරිය,
අධ්‍යක්‍ෂ ජනරාල්.

ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව,
5 වන මහළ, සෙත්සිරිපාය,
බත්තරමුල්ල

ආදර්ශ අයදුම්පත්‍රය

ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර (තාක්ෂණික) සේවා ගණයේ පරීක්ෂක තනතුරෙහි පුහුණු ශ්‍රේණිය හා සැලසුම් ශිල්පී තනතුරෙහි පුහුණු ශ්‍රේණිය සඳහා බඳවා ගැනීමේ සීමිත තරඟ විභාගය - 2015

(i) ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ පරීක්ෂක, පුහුණු ශ්‍රේණිය ☐

(ii) ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ සැලසුම් ශිල්පී, පුහුණු ශ්‍රේණිය ☐
(අදාළ අංකය කොටුවෙහි ✓ ලකුණ යොදා සලකුණු කරන්න.)

☐
කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා

ලිඛිත තරඟ විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය :
සිංහල - S
දෙමළ - T ☐
(අදාළ ඉංග්‍රීසි අකුර කොටුව තුළ ලියන්න)

01. (i) සම්පූර්ණ නම :————.
(ii) මුලකුරු සමඟ නම (සිංහලෙන්/දෙමළෙන්) :————.
(iii) සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් සඳහන් කරන්න). :————.

02. ලිපිනය හා දුරකථන අංක :
(i) කාර්යාලීය ලිපිනය :————.
දුරකථන අංකය :————.
(ii) පෞද්ගලික ලිපිනය :————.

(iii) විභාග ප්‍රවේශ පත්‍රය එවිය යුතු ලිපිනය :————.

(iv) ජංගම දුරකථන අංකය :————.

03. ස්ත්‍රී/පුරුෂ භාවය ඃ
පුරුෂ - 0
ස්ත්‍රී -1 (අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

04. ජාතික හැඳුනුම්පත් අංකය ඃ

05. (i) උපන් දිනය ඃ වර්ෂය : මාසය : දිනය :

(ii) ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස ඃ

අවුරුදු : මාස : දින :

06. විවාහක/අවිවාහක බව ඃ
අවිවාහක - 1
විවාහක - 2
(අදළ අංකය කොටුව තුළ ලියන්න.)

07. අ.පො.ස. (සා. පෙළ.) විභාගය පිළිබඳ විස්තර (පළමුවර) (කරුණාකර පිටපත් අමුණන්න.)

(i) විභාගය සමත් වූ වර්ෂය සහ මාසය :————.

(ii) අයදුම්කරුගේ විභාග අංකය :————.

| *විෂයය* | *සාමාර්ථය* | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|---|
| .................................... | .................. | .................................... | .................. |
| .................................... | .................. | .................................... | .................. |
| .................................... | .................. | .................................... | .................. |
| .................................... | .................. | .................................... | .................. |
| .................................... | .................. | .................................... | .................. |

08. අ.පො.ස. (සා. පෙළ) විභාගය පිළිබඳ විස්තර (දෙවැනි වර) අවශ්‍ය නම් පමණක් (කරුණාකර පිටපත් අමුණන්න.)

(i) විභාගය සමත් වූ වර්ෂය සහ මාසය :————.

(ii) අයදුම්කරුගේ විභාග අංකය :————.

| *විෂයය* | *සාමාර්ථය* | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|---|
| .................................... | .................. | .................................... | .................. |
| .................................... | .................. | .................................... | .................. |
| .................................... | .................. | .................................... | .................. |

09. අදළ ක්ෂේත්‍රය සම්බන්ධව ලබා ඇති පළපුරුද්ද ඃ

.........................................................................................................................................................
.........................................................................................................................................................
.........................................................................................................................................................
.........................................................................................................................................................

10. වෙනත් සුදුසුකම් ඃ තාක්ෂණ/වෘත්තීය (කරුණාකර පිටපත් අමුණන්න.) ඃ

.........................................................................................................................................................
.........................................................................................................................................................
.........................................................................................................................................................

11. සේවා විස්තර :
(i) ඔබ දැනට සේවය කරන තනතුර :————.
(ii) දැනට දරන තනතුරට පත් වූ දිනය :————.
(iii) දැනට දරන තනතුර ස්ථිර කළ දිනය :————.
(iv) දැනට දරන තනතුර ස්ථිර කරමින් නිකුත් කරන ලද ලිපියේ ගොනු අංකය හා දිනය :————.
(v) වැටුප් පරිමාණය (රා. ප. ච. 06/2006 (vi) අනුව) :————.
(vi) දැනට ලබන මාසික වැටුප :————.
(vii) දැනට දරන තනතුරේ සේවා කාලය :————.

12. විභාග ගාස්තු :

මුදල් ගෙවූ රිසිට්පත් අංකය | | | | | | | | | | | | | | | |

රු. 1,000.00 ක් වන විභාග ගාස්තු ගෙවන ලද කුවිතාන්සිය නොගැලවෙන පරිදි මෙහි අලවන්න.
(කුවිතාන්සියේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.)

13. අයදුම්කරුගේ ප්‍රකාශය :

ඉහත සඳහන් තොරතුරු මා දන්නා පරිදි සත්‍ය හා නිවැරදි බව මම මෙයින් සහතික කරමි. තවද, මෙහි ඇතුළත් කිසියම් තොරතුරක් අසත්‍ය හා සාවද්‍ය බව සොයා ගතහොත් එම සොයා ගැනීම, තෝරා ගැනීමට පෙර සිදුවුවහොත් මා නුසුදුස්සෙකු වන බවත්, පත්වීම ලැබීමෙන් පසුව සොයා ගනු ලැබුවහොත් කිසිදු වන්දියක් නොමැතිව සේවයෙන් පහ කිරීමට ලක්වන බව ද දනිමි.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

14. අයදුම්කරුගේ/අයදුම්කාරියගේ අත්සන සහතික කිරීම :

මෙම ඉල්ලුම්පත්‍රය ඉදිරිපත් කරන ................................................ (සම්පූර්ණ නම) යන අය මා පෞද්ගලිකව හඳුනන බවත්,.......................... දින ඔහුගේ/ඇයගේ අත්සන මා ඉදිරියේ දී තැබූ බවත් මෙයින් සහතික කරමි.

————,
සහතික කරන නිලධාරියාගේ අත්සන.

දිනය :————.

සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම :————.
තනතුර :————.
ලිපිනය :————.
නිල මුද්‍රාව :————.

15. රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා පමණි.

01. මෙම ඉල්ලුම්කරු වන ......................... මහතා/මහත්මිය/මෙනෙවිය දැනට මෙම අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ ............ වශයෙන් ස්ථිර/තාවකාලික/අනියම් සේවකයෙකු/සේවිකාවක, ලෙස සේවය කරන බවත්,
02. ඔහු/ඇය ............ තනතුරේ ............ දින සිට ස්ථිර කර ඇති බවද,
03. ඔහු/ඇය ............ දිනට පූර්වාසන්න අවුරුදු 05 ක සක්‍රීය හා සතුටුදයක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති බවද,
04. ඔහුගේ/ඇයගේ වැඩ හා හැසිරීම ............ වැනි දිනට පූර්වාසන්න අවුරුදු 05 ඇතුළත සතුටුදායක ව පැවති බවද,
05. ඔහුගේ/ඇයගේ අයදුම්පතෙහි දක්වෙන විස්තර පෞද්ගලික ලිපිගොනුව අනුව නිවැරදි බවත් මෙම විභාගයට අදාළ නිවේදනයේ දක්වෙන රෙගුලාසි අනුව මෙම විභාගයට පෙනී සිටීමට ඔහු/ඇය සුදුසු බවද, මම සහතික කරමි.
06. ඔහු/ඇය මෙම තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත් සේවයෙන් නිදහස් කළ හැකි/නොහැකි බවත් දන්වමි.

————,
ආයතන ප්‍රධානියාගේ හෝ බලය
පැවරුණු නිලධාරියාගේ අත්සන.

දිනය :————.

නම :————.
තනතුර :————.
ලිපිනය :————.
නිල මුද්‍රාව :

11-144/1

## මහා නගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය

## ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව

### ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර (තාක්ෂණ) සේවා ගණයේ පරීක්ෂක, III ශ්‍රේණිය (ශ්‍රී. ලං.තා. සේ.) හා සැලසුම් ශිල්පී, පුහුණු ශ්‍රේණිය (ශ්‍රී. ලං. තා. සේ.) සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2015

1.0 ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුවේ ඉහත සඳහන් තනතුරු පුරප්පාඩු පිරවීම සඳහා මෙම නිවේදනයේ දක්වා ඇති අවම සුදුසුකම් සපුරා ඇති ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් ජාතික භෞතික සැලසුම් අධ්‍යක්ෂ ජනරාල් විසින් අයදුම්පත් කැඳවනු ලැබේ.

2.0 මෙම නිවේදනය අවසානයේ දක්වා ඇති ආදර්ශ ආකෘතියට අනුව ඒ4 කඩදාසියේ දෙපැත්ත භාවිතා කරමින් පිළියෙල කරන ලද අයදුම්පත්‍රයක් 2015 නොවැම්බර් 30 වැනි දිනට හෝ එදිනට ප්‍රථම ''අධ්‍යක්ෂ ජනරාල්, ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය, 28/10, මලලසේකර මාවත, කොළඹ 07'' යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරෙහි ''ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ පරීක්ෂක, III ශ්‍රේණිය තනතුරට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය'' හෝ ''ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ සැලසුම් ශිල්පී, පුහුණු ශ්‍රේණිය තනතුරට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය'' යනුවෙන් උචිත පරිදි පැහැදිලිව සටහන් කළ යුතුය. ප්‍රමාද වී ලැබෙන, අපැහැදිලි හා අසම්පූර්ණ අයදුම්පත් කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

3.0 සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :

3.1 මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු අනත්දරු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය.

3.2 රාජ්‍ය සේවයේ පත්වීම් සම්බන්ධයෙන් වන ආයතන සංග්‍රහයේ II පරිච්ඡේදයේ 10-12 දක්වා වගන්ති ද කාර්ය පටිපාටික රීති ද අදාළ වේ.

3.3 තෝරා ගනුලබන අයදුම්කරුවන් ආයතන සංග්‍රහයේ විධිවිධාන වලටද, මුදල් රෙගුලාසි වලටද, දෙපාර්තමේන්තු නියෝග වලටද, කලින් කල රජය විසින් නිකුත් කරනු ලබන වෙනත් රෙගුලාසි හා නියෝග වලටද යටත් විය යුතුය.

4.0 සාමාන්‍ය සුදුසුකම් :

4.1 ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතුය.
4.2 විශිෂ්ට චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්වයකින් යුක්ත විය යුතුය.
4.3 බඳවා ගන්නා නිලධාරින් දිවයිනේ කවර ප්‍රදේශයක වුවද සේවය කිරීමට කැමති විය යුතුය.
4.4 ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ 30ට නොවැඩි විය යුතුය.

5.0 අවශ්‍ය අධ්‍යාපන සුදුසුකම් :

5.1 සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, විද්‍යාව, ගණිතය සහ තවත් එක් විෂයයකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම.

*හා*

5.2 ශුද්ධ ගණිතය/ව්‍යවහාර ගණිතය/සංයුක්ත ගණිතය සහ භෞතික විද්‍යාව යන විෂයයන් දෙකක් සහිතව විද්‍යා/ගණිත විෂය ධාරාවට අයත් විෂයයන් තුනකින් අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය එකවර සමත්වීම.

6.0 වෘත්තීය සුදුසුකම් :

6.1 ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ පරීක්ෂක, III ශ්‍රේණිය

ඉහත 5.0 හි අධ්‍යාපන සුදුසුකම්වලට අමතරව ක්ෂේත්‍රයට අදළ පහත සඳහන් වෘත්තීය සුදුසුකම් වලින් එකක් සම්පූර්ණ කර ඉල්ලුම්පත්‍ර භාර ගන්නා අවසන් දිනය වන විට අදළ සහතිකය ලබා තිබීම.

(i) මොරටුව විශ්ව විද්‍යාලය හෝ අම්පාර හාඩි ආයතනය විසින් පිරිනමනු ලබන ජාතික තාක්ෂණික ඩිප්ලෝමාව

*හෝ*

(ii) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය විසින් පිරිනමනු ලබන ඉංජිනේරු විද්‍යා ජාතික ඩිප්ලෝමාව

*හෝ*

(iii) අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පිරිනමනු ලබන ජාතික උසස් ඉංජිනේරු ඩිප්ලෝමාව

*හෝ*

(iv) තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයක් විසින් පිරිනමනු ලබන දෑවුරුදු කෘෂිකර්ම ඩිප්ලෝමාව

*හෝ*

(v) ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය විසින් පිරිනමනු ලබන තාක්‍ෂණික ඩිප්ලෝමාව

*හෝ*

(vi) ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පවත්වනු ලබන ඉංජිනේරු විභාගයේ I වන කොටස සාර්ථකව සම්පූර්ණ කිරීම

*හෝ*

(vii) රැකියා ක්ෂේත්‍රයට අදාළව ජාතික වෘත්තීය කුසලතා (NVQ) 06 මට්ටමේ සුදුසුකම් සම්පූර්ණ කිරීම,

*හෝ*

(viii) උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ ඉහත සඳහන් තාක්‍ෂණ සහතික නිකුත් කරන ආයතනවලින් අදහස් ලබා ගැනීමෙන් අනතුරුව ඉහත සඳහන් තාක්‍ෂණික සුදුසුකම්වලට සියළු අතින් සමානයයි තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වෙනත් තාක්‍ෂණික සුදුසුකම් ලබා තිබීම.

6.2 ශ්‍රී ලංකා තාක්‍ෂණ සේවයේ සැලසුම් ශිල්පී, පුහුණු ශ්‍රේණිය

ඉහත 5.0 හි අධ්‍යාපන සුදුසුකම්වලට අමතරව ක්ෂේත්‍රයට අදළ පහත සඳහන් වෘත්තීය සුදුසුකම්වලින් එකක් සම්පූර්ණ කර ඉල්ලුම්පත්‍ර භාර ගන්නා අවසන් දිනය වන විට අදළ සහතිකය ලබා තිබීම.

(i) තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් කාර්මික විද්‍යාලයක සැලසුම් ශිල්පය පිළිබඳ එක් අවුරුදු පූර්ණකාලීන පුහුණු පාඨමාලාව සාර්ථකව සම්පූර්ණ කර අදළ සහතිකය ලබා තිබීම.

සටහන : ඉහත 5.0 හි සඳහන් අධ්‍යාපන සුදුසුකම් හා 6.2 හි සඳහන් සැලසුම් ශිල්පී, පුහුණු ශ්‍රේණිය සඳහා නියමිත වෘත්තීය සුදුසුකම් සහිත අයදුම්කරුවන්, සේවයට අදළ විෂය නිර්දේශය අනුව ලබා ගන්නා එක් වසරක න්‍යායාත්මක හා ප්‍රායෝගික පුහුණුව සාර්ථකව නිම කොට අදළ විභාගය සමත් වීමෙන් පසු ශ්‍රී ලංකා තාක්‍ෂණ සේවයේ III ශ්‍රේණියේ වැටුප් පරිමාණයේ ආරම්භක පියවරේ තබනු ඇත.

07. තෝරා ගැනීමේ පදනම :

7.1 ලිඛිත තරග විභාගයේ කොන්දේසි :
මේ සඳහා වන ලිඛිත විභාගය ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව වෙනුවෙන් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්‍ෂ ජනරාල් මගින් පවත්වනු ලබන අතර, ඔහු විසින් දැනුම් දෙනු ලබන දිනක දී විභාගය පැවැත්වෙනු ඇත. ඔහු විසින් පනවනු ලබන නීති රීතිවලට විභාග අපේක්‍ෂකයින් යටත් විය යුතු වේ.

7.2 සුදුසුකම් සහිත අයදුම්කරුවන් ලිඛිත තරග විභාගයකට යොමු කරන අතර, සම්මුඛ පරීක්‍ෂණයට පෙනී සිටීම සඳහා එක් එක් ප්‍රශ්න පත්‍රයට අවම වශයෙන් 40% ක ලකුණු ප්‍රමාණයක් ලබා ගත යුතු ය.

එම විභාගයේ ලකුණු ලබාගත් අනුපිළිවෙල අනුව සම්මුඛ පරීක්‍ෂණයකට භාජනය කර සුදුස්සන් එම ලකුණු අනුපිළිවෙල අනුව තෝරාගනු ලැබේ. සම්මුඛ පරීක්‍ෂණයේදී ලකුණු ලබා දෙනු නොලබන අතර බඳවා ගැනීම් පරිපාටි හා ඊට අනුකූලව ප්‍රසිද්ධ කරනු ලබන නිවේදනය සුදුසුකම් සපුරා තිබේදැයි පරීක්‍ෂා කරනු ලැබේ.

7.3 ලිඛිත විභාගයට අදළ විස්තර පහත පරිදි වේ. :-

| *විෂයයන්* | *කාලය* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු ප්‍රමාණය* |
|---|---|---|---|
| 01. බුද්ධි පරීක්‍ෂණය | පැය 01කි | 100 | 40 |
| 02. විෂයානුබද්ධ තාක්‍ෂණික පරීක්‍ෂණය | පැය 03කි. | 100 | 40 |

| *විෂයයන්* | *විෂය නිර්දේශය* |
|---|---|
| 01. බුද්ධි පරීක්‍ෂණය | අවබෝධ කර ගැනීමේ ශක්තිය, සිතීමේ තර්කානුකූලභාවය, විශ්ලේෂණ තත්ත්වය, ක්‍ෂණිකව නිවැරදි තීරණ ගැනීමේ හැකියාව, සංඛ්‍යානමය හා ගණිතමය ගැටළු විසඳීමේ හැකියාව, භාෂා බණ්ඩ, වගු, පිංතූර, ප්‍රස්ථාර උපයෝගී කර ගැනීම හා පරීක්‍ෂා කිරීම යනාදිය පිළිබඳ දැනුම පරීක්‍ෂා කෙරේ. (බහුවරණ ප්‍රශ්න 40ක් ඇතුළත් ප්‍රශ්න පත්‍රයකි. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු අපේක්‍ෂා කෙරේ.) |
| 02. විෂයානුබද්ධ තාක්‍ෂණික පරීක්‍ෂණය | පරීක්‍ෂක III ශ්‍රේණිය<br>I කොටස<br>- මිනුම් හා මට්ටම් ගැනීම |

| *විෂයයන්* | *විෂය නිර්දේශය* |
|---|---|
| | දම්වැල් මැණුම, තියෝඩලයිට් මැණුම (ඉලෙක්ට්‍රොනික දුර මැනීමේ උපකරණ, EDM/Total Station) තලමිතික මැණුම, දම්වැල් හා කෝණ දෝෂ, සංක්‍රාන්ති තියෝඩලයිට්ටුවේ සීරුමාරුව, වර්ග ඵලය ආගනනය, බණ්ඩාංක හා පස් වැඩ ගණනය කිරීම<br>- මිනින්දෝරු මිනුම් උපකරණ ස්ථාපනය කිරීම<br>- කාර්ය පිහිටුවීම හා ඉඩම් කැබලි කිරීම<br>- ඩම්පි ලෙවලයේ සහ ඉංජිනේරු ලෙවලයේ සීරුමාරුව, මට්ටම් ගැනීමේ දෝෂ, මුහුදු මට්ටම, ආරම්භය හා ස්ථිර පිල් ලකුණු, සමෝච්ච රේඛා ලබා ගැනීම සඳහා උපකරණ භාවිතය හා උස නැග්ම හා බැස්ම ක්‍රමයෙන් මට්ටම් ගැනීම<br><br>II කොටස<br>- ගොඩනැගිලි ඉදි කිරීම<br>ගොඩනැගිලි අත්තිවාරම්, ගඩොල් වැඩ, බැමි වර්ග, කලු ගල් වැඩ, සිමෙන්ති ගල් හා කොන්ක්‍රීට් වැඩ, වැරගැන්වූ කොන්ක්‍රීට් වැඩ, ලී වැඩ, මූට්ටු වහල හා කාප්ප, පයිප්ප වැඩ, ජල අපවහනය හා ජලසම්පාදනය (ගොඩනැගිලි), ප්‍රමාණ පත්‍ර හා ඇස්තමේන්තු පිළියෙල කිරීම<br><br>සැලසුම් ශිල්පී පුහුණු ශ්‍රේණිය<br><br>මෙම ප්‍රශ්න පත්‍රය කොටස් 02කින් යුක්ත වන අතර, පළමු හෝ දෙවන කොටසට පමණක් පිළිතුරු බලාපොරොත්තු වේ.<br><br>I කොටස - සැලසුම් ශිල්පය<br><br>දෙන ලද සැලැස්මක් පරිමාණයට අනුව ඇඳීමේ පුවරු උපයෝගී කරගෙන පහත අවශ්‍යතා සපිරෙන අයුරින් ඇඳිය යුතුය.<br><br>01. සැලැස්ම<br>02. ඉදිරි පෙනුම<br>03. පැති පෙනුම<br>04. දොර ජනෙල් විවරයන් පිළිබඳ විස්තර<br>05. දෙන ලද මාතෘකාවක් උපදෙස් පරිදි සටහන් කිරීම<br>දළ සැලැස්මක් පරිමාණයට අනුව වැඩි දියුණු කර ඇඳීමේ හැකියාව, නිර්මාණාත්මක කුසලතාවය (ත්‍රිමාන ආකෘති හා පර්යාවලෝකන ඇඳීම), සිද්ධාන්ත ප්‍රායෝගිකව යොදා ගැනීමේ හැකියාව ආදිය අදාළ වේ.<br><br>II කොටස - ප්‍රමාණ ගැනීම<br><br>දළ සැලැස්මක ප්‍රමාණ ගැනීමේ හැකියාව, සිද්ධාන්ත ප්‍රායෝගිකව යොදා ගැනීමේ හැකියාව පිළිබඳ මූලික දැනුම හා දෙන ලද සැලැස්මක අත්තිවාරම් මට්ටම දක්වා විස්තරාත්මක ප්‍රමාණ ගැනීම. (මෙහිදී ශ්‍රී ලංකා සම්මත මිනුම් ක්‍රමයේ පිරිවිතරයන් පිළිබඳ නියමයන්ට අනුකූලවීම විශේෂ කුසලතාවයක් ලෙස සැලකනු ලැබේ. අවශ්‍ය නම් ශ්‍රී ලංකා සම්මත මිනුම් ක්‍රමය ග්‍රන්ථය විභාගයේ දී පරිශීලනය කළ හැක.) |

8.0 *බඳවා ගැනීම :*

ඉහත 5.0 සහ 6.0 යටතේ අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් ලබා ඇති ලිඛිත විභාගය සමත් අයදුම්කරුවන් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයකින් පසු ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ පරීක්ෂක III පන්තියට හා සැලසුම් ශිල්පී පුහුණු කිරීමේ ශ්‍රේණියට බඳවා ගනු ලැබේ.

9.0 *වැටුප් පරිමාණය :*

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක : 6/2006 (iv) හි MN 3-2006A යටතේ,
ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ පරීක්ෂක, III පන්තිය
රු. 15,005-4-x180-6x240-11x320-20x360-27,885
ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ සැලසුම් ශිල්පී, පුහුණු කිරීමේ ශ්‍රේණිය
1 වසර - රු. 12,920

10.0 *විභාග ගාස්තු :*

විභාග ගාස්තුව රු. 1,000 කි. අයදුම්කරුවන් විසින් ආපසු නොගෙවනු ලබන රු. 1,000 ක විභාග ගාස්තුවක් ශ්‍රී ලංකාව පුරා පිහිටි ඕනෑම තැපැල් කාර්යාලයක් මගින් (උප තැපැල් කාර්යාල හැර) ''SLIDA'' ගිණුම වෙත ගෙවිය යුතු අතර, ඒ ගෙවීමට අදාළව ලබා දෙන රිසිට් පතේ අංකය විභාග අයදුම්පතේ අංක 12 යටතේ ඇතුලත් කළ යුතුයි.

අදාළ තැපැල් කාර්යාලයේ දී ''SLIDA'' ගිණුම වෙත මුදල් ගෙවීමේ ඉල්ලුම්පත්‍රය පිරවීමේ දී, මුදල් ලබා ගන්නා ලෙස ''SLIDA'' යන්න ද මුදල් ලබාගන්නාගේ ලිපිනය යන ස්ථානයේ ඔබට අදාළ විභාගයේ සංකේත නාමය ද සටහන් කරන්න. (සංකේත නාමයන් පහත වගුවේ දක්වා ඇත.)

| *විභාගයේ නම* | *සංකේත නාමය* |
|---|---|
| 01. ශ්‍රී ලංකා තාක්‍ෂණ සේවයේ පරීක්‍ෂක, III පන්තිය | SLTS (iii) |
| 02. ශ්‍රී ලංකා තාක්‍ෂණ සේවයේ සැලසුම් ශිල්පී, පුහුණු කිරීමේ ශ්‍රේණිය | SLTS (G,T) |

තවද, ගිණුම වෙත මුදල් යවන්නා ලෙස අයදුම්කරුගේ නම ද, මුදල් යවන්නාගේ ලිපිනය යන ස්ථානයේ අයදුම්කරුගේ ජාතික හැඳුනුම්පත් අංකය ද, ඇතුලත් කර ඉල්ලුම් පත්‍රය සම්පූර්ණ කළ යුතුයි.

11. යම් අයදුම්කරුවෙකුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබීම හේතුවෙන් ඔහු/ඇය නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමෙන්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුවහොත් ඔහු/ඇය සේවයෙන් පහ කිරීමටත් ඉඩ ඇත.

12. අත්සන සහතික කිරීම ඃ
අයදුම්කරුවන් තම ආදර්ශ අත්සන, රජයේ පාසල් ප්‍රධානියෙකු/විශ්‍රාමික ප්‍රධානියකු, කොට්ඨාසයේ ග්‍රාම නිලධාරිවරයෙකු, සාමදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතිඥවරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරිලත් නිලධාරියෙකු හෝ රු. 240,360 හෝ ඊට වැඩි හෝ වාර්ෂික වැටුපක් ලබන රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ හෝ ස්ථිර මාණ්ඩලික නිලධාරියෙකු හෝ නායක ස්වාමීන් වහන්සේ නමක් හෝ අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර පූජ්‍ය තත්වයේ සැලකිය යුතු තත්වයක් දරන අයකු ලවා සහතික කරවා ගත යුතුය. දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු අපේක්‍ෂකයන් සිය අයදුම්පත්‍රය ආයතන ප්‍රධානියා මඟින් එවිය යුතු ය.

මෙහි සඳහන් නොවන කරුණක් සඳහා තීරණ ගැනීමේ බලධාරියා ජාතික භෞතික සැලසුම් අධ්‍යක්‍ෂ ජනරාල් වේ.

වෙරන්ජන් කුරුකුලසූරිය,
අධ්‍යක්‍ෂ ජනරාල්.

ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව,
5 වන මහළ, සෙත්සිරිපාය,
බත්තරමුල්ල.

ආදර්ශ අයදුම් පත්‍රය

***ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව***

(i) ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ පරික්ෂක, III ශ්‍රේණිය ☐

(ii) ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ සැලසුම් ශිල්පී, පුහුණු ශ්‍රේණිය ☐
(අදාල අංකය කොටුවෙහි ✓ ලකුණ යොදා සලකුණු කරන්න.)

☐
කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා

ලිඛිත තරග විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය ඃ
සිංහල - S
දෙමළ - T ☐
(අදාළ ඉංග්‍රීසි අකුර කොටුව තුළ ලියන්න)

01. (i) සම්පූර්ණ නම :—————.
(ii) මුලකුරු සමග නම (සිංහලෙන්/දෙමළෙන්) :—————.
(iii) සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් සඳහන් කරන්න). :—————.

02. ලිපිනය හා දුරකථන අංක ඃ
(i) කාර්යාලීය ලිපිනය :—————.
දුරකථන අංකය :—————.
(ii) පෞද්ගලික ලිපිනය :—————.

(iii) දුරකථන අංකය :—————.

(iv) ජංගම දුරකථන අංකය :—————.

03. ස්ත්‍රී/පුරුෂ භාවය ඃ
පුරුෂ - 0
ස්ත්‍රී -1 (අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

04. ජාතික හැඳුනුම්පත් අංකය

05. (i) උපන් දිනය ඃ වර්ෂය : මාසය : දිනය :

(ii) ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස ඃ

අවුරුදු : මාස : දින :

06. විවාහක/අවිවාහක බව ඃ
අවිවාහක - 1
විවාහක - 2
(අදළ අංකය කොටුව තුළ ලියන්න.)

07. අ.පො.ස. (සා. පෙළ.) විභාගය පිළිබඳ විස්තර (පළමුවර) (කරුණාකර පිටපත් අමුණන්න.)

(i) විභාගය සමත් වූ වර්ෂය හා මාසය :—————.

(ii) අයදුම්කරුගේ විභාග අංකය :—————.

| *විෂයය* | *සාමාර්ථය* | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|---|
| ................................... | .................. | ................................... | .................. |
| ................................... | .................. | ................................... | .................. |
| ................................... | .................. | ................................... | .................. |
| ................................... | .................. | ................................... | .................. |
| ................................... | .................. | ................................... | .................. |

08. අ.පො.ස. (සා. පෙළ) විභාගය පිළිබඳ විස්තර (දෙවැනි වර) අවශ්‍ය නම් පමණක් (කරුණාකර පිටපත් අමුණන්න.)

(i) විභාගය සමත් වූ වර්ෂය සහ මාසය :—————.

(ii) අයදුම්කරුගේ විභාග අංකය :—————.

| *විෂයය* | *සාමාර්ථය* | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|---|
| ................................... | .................. | ................................... | .................. |
| ................................... | .................. | ................................... | .................. |
| ................................... | .................. | ................................... | .................. |

09. අ. පො. ස. (උ/පෙළ) විභාගය පිළිබඳ විස්තර (කරුණාකර පිටපත් අමුණන්න.)

(i) විභාගය සමත් වූ වර්ෂය සහ මාසය :—————.

(ii) අයදුම්කරුගේ විභාග අංකය :—————.

| *විෂයය* | *සාමාර්ථය* | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|---|
| ................................... | .................. | ................................... | .................. |
| ................................... | .................. | ................................... | .................. |

10. අනෙකුත් සුදුසුකම් : තාක්‍ෂණ/වෘත්තීය (කරුණාකර පිටපත් අමුණන්න.)

.................................................................................................................................
.................................................................................................................................
.................................................................................................................................

11. අදාළ ක්ෂේත්‍රය සම්බන්ධව ලබා ඇති පළපුරුද්ද :

.................................................................................................................................
.................................................................................................................................
.................................................................................................................................

12. විභාග ගාස්තු :

මුදල් ගෙවූ රිසිට්පත් අංකය | | | | | | | | | | | | | | |

රු. 1,000 ක් වන විභාග ගාස්තු ගෙවන ලද කුවිතාන්සිය නොගැලවෙන පරිදි මෙහි අලවන්න.
(කුවිතාන්සියේ ඡායා පිටපත් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත)

13. අයදුම්කරුගේ ප්‍රකාශය :

ඉහත සඳහන් තොරතුරු මා දන්නා පරිදි සත්‍ය හා නිවැරදි බව මම මෙයින් සහතික කරමි. තවද, මෙහි ඇතුළත් කිසියම් තොරතුරක් අසත්‍ය හා සාවද්‍ය බව සොයා ගතහොත් එම සොයා ගැනීම තෝරා ගැනීමට පෙර සිදුවුවහොත් මා නුසුදුස්සෙකු වන බවත්, පත්වීම ලැබීමෙන් පසුව සොයා ගනු ලැබුවහොත් කිසිදු වන්දියක් නොමැතිව සේවයෙන් පහ කිරීමට ලක්වන බව ද දනිමි.

————,
ඉල්ලුම්කරුගේ අත්සන

දිනය :————.

14. අයදුම්කරුගේ/අයදුම්කාරියගේ අත්සන සහතික කිරීම :

මෙම ඉල්ලුම්පත්‍රය ඉදිරිපත් කරන ............................................... (සම්පූර්ණ නම) යන අය මා පෞද්ගලිකව හඳුනන බවත්,......................... දින ඔහුගේ/ඇයගේ අත්සන මා ඉදිරියේ දී තැබූ බවත් මෙයින් සහතික කරමි.

————,
සහතික කරන නිලධාරියාගේ අත්සන

දිනය :————.

සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම :————.
තනතුර :————.
ලිපිනය :————.
නිල මුද්‍රාව :————.

15. රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා පමණි.

මෙම ඉල්ලුම්කරු වන.................. මහතා/මහත්මිය/මෙනෙවිය දැනට මෙම අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ.................. වශයෙන් ස්ථිර/තාවකාලික/අනියම් සේවකයෙකු/සේවිකාවක ලෙස සේවය කරන බවත්, ඔහු/ඇය මෙම තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත් සේවයෙන් නිදහස් කළ හැකි/නොහැකි බවත් දන්වමි.

————,
ආයතන ප්‍රධානියාගේ අත්සන

දිනය :————.

නම :————.
තනතුර :————.
ලිපිනය :————.
නිල මුද්‍රාව :

11-144/2

## රාජ්‍ය සේවා කොමිෂන් සභාව

### ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත/ සීමිත තරඟ විභාගය - 2013 (2014)

අංකඃ 1933 හා 2015. 09. 18 දිනැති *ගැසට් නිවේදනයෙන්* සංශෝධිත අංකඃ 1929 හා 2015. 08. 21 දිනැති *ගැසට් නිවේදනයේ* සඳහන් උක්ත බඳවා ගැනීම සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩුවක් විභාග වන බැවින් එම බඳවා ගැනීම පහත සඳහන් කොන්දේසිවලට යටත්ව තාවකාලිකව අත්හිටුවීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාව තීරණය කර ඇති බව දන්වා සිටිමි.

I. ඉහත බඳවා ගැනීමට අදාළව නිකුත් කර ඇති එම *ගැසට් නිවේදනයන්* අනුව ඉදිරිපත් කර ඇති අයදුම්පත් ඉදිරියේ දී පවත්වනු ලබන විවෘත/ සීමිත තරඟ විභාගය සඳහා වලංගු වන අතර, එම අයදුම්කරුවන් නැවත අයදුම්පත් ඉදිරිපත් කිරීමට අවශ්‍ය නො වන බව.

II. මෙම විවෘත/ සීමිත බඳවා ගැනීමට අදාළව සම්පූර්ණ කළ යුතු සුදුසුකම් සලකා බැලිය යුත්තේ මේ වන විටත් ප්‍රසිද්ධ කර ඇති ඉහත සඳහන් *ගැසට් නිවේදනවල* සඳහන් අයදුම්පත් කැඳවීමේ අවසාන දිනය වන 2015. 09. 21 දිනට වීම.

ඒ අනුව ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත/ සීමිත තරඟ විභාගය - 2013 (2014) පැවැත්වෙන දිනය ඉදිරියේ දී දැනුම් දෙන බව වැඩිදුරටත් දන්වමි.

ලේකම්,
කෘෂිකර්ම අමාත්‍යාංශය.

2015 ඔක්තෝබර් මස 22 වැනි දින
රජමල්වත්ත පටුමග
බත්තරමුල්ල

11-183

---

### ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ III ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන පළමුවන සහ දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාග - 2015

01. ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ III වන ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන පළමුවන සහ දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාග, විභාග කොමසාරිස් ජනරාල් විසින් 2016 පෙබරවාරි මස කොළඹ දී පවත්වනු ලැබේ. මෙම පරීක්ෂණ සඳහා අයදුම්පත්‍ර භාර ගන්නා අවසන් දිනය 2015.12.07 වෙනි දින බවට මෙයින් නිවේදනය කරනු ලැබේ.

02. පළමුවන සහ දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාග සඳහා ඉල්ලුම් කිරීමේ ආදර්ශ අයදුම්පත්‍ර මෙම නිවේදනය අවසානයේ පළ කර ඇත. එම ආදර්ශ අයදුම්පත්‍රය අනුව අපේක්ෂකයන් විසින් ඒ 4 ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්ත භාවිතා කරමින් අංකය 01 සිට 04 තෙක් විස්තර මුල් පිටුවේ ද, සෙසු කොටස් දෙවන පිටුවේ ද ඇතුළත් කර තම අයදුම්පත සකස් කළ යුතුය.අවශ්‍ය තොරතුරු සම්පූර්ණ කළ යුත්තේ අපේක්ෂකයා විසින් සිය අත් අකුරිනි.

2.1 තවද අයදුම්පත්‍රය පිළියෙල කර ගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල භාෂා ඉල්ලුම්පත්‍ර වල සිංහල භාෂාවට අමතරව ඉංග්‍රීසි භාෂාවෙන්ද, දෙමළ භාෂා ඉල්ලුම් පත්‍ර වල දෙමළ භාෂාවට අමතරව ඉංග්‍රීසි භාෂාවෙන්ද සඳහන් කළ යුතුය.

2.2 ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන ඉල්ලුම්පත්‍ර, අයදුම්පත්‍ර භාර ගන්නා අවසන් දිනට පසුව ලැබෙන හා අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති අයදුම්පත්‍ර දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. ආදර්ශ ඉල්ලුම්පත්‍රයේ ඉහළින් ඇති සියලුම තොරතුරු නිවැරදිව සඳහන් කළ යුතුය.

03. අයදුම්පත්‍ර තම දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් (උදා. ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙහි නම් ප්‍රාදේශීය ලේකම් මගින් ) 2015 12.07 දින හෝ ඊට පෙර "විභාග කොමසාරිස් ජනරාල්, සංවිධාන හා විදේශ විභාග ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැ.පෙ. 1503, කොළඹ" යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු අතර, අයදුම්පත්‍ර විභාග කොමසාරිස් ජනරාල් වෙත බහා එවනු ලබන කවරයේ වමත් පස ඉහළ කෙළවරේ විභාගයේ නම සඳහන් කළ යුතුය. අයදුම්පත්‍රයේ ඡායා පිටපත් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි යන භාෂා මාධ්‍ය වලින් පැවැත්වෙන අතර ඉල්ලුම් කළ මාධ්‍යය පසුව වෙනස් කළ නොහැක. රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය සඳහා වන අවශ්‍යතාවන් සම්පූර්ණ කිරීම සඳහා නව ප්‍රවේශයක නිලධාරීන් විසින් තම අයදුම්පත්‍ර රාජ්‍ය භාෂාවෙන් හෝ තමන් සේවයට බඳවා ගන්නා ලද භාෂා මාධ්‍යය අනුව දෙමළ භාෂාවෙන්/ ඉංග්‍රීසි භාෂාවෙන් හෝ පිළියෙල කොට ඉදිරිපත් කළ හැකිය.

04. නිවේදනයේ සඳහන් අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර විභාග ගාස්තු ගෙවීම අදාළ නම් ඊට අදාළ ලදුපත සමග විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍ය, අයදුම්කරුගේ අත්සන හා අත්සන සහතික කිරීම ද, දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය ද සහිතව නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමු කොට ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශ පත්‍ර

නිකුත් කරනු ඇත. අපේක්ෂකයන් වෙත ප්‍රවේශපත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරනු ඇත.

4.1 නිවේදනය පළ වී දින 02 ක් හෝ 03 ක් ගතවූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබී ඇත්නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතු ය. එහිදී අයදුම්කරුගේ සම්පූර්ණ නම, ලිපිනය, ජාතික හැඳුනුම්පත් අංකය හා ඉල්ලුම් කරන ලද විභාගයේ නම සඳහන් කළ යුතු ය. කොළඹින් බැහැර අයදුම්කරුවෙකු නම් ඉහත විස්තර සමග ප්‍රවේශ පත්‍රයේ පිටපතක් එවිය හැකි ෆැක්ස් අංකයක්ද සහිතව ඉල්ලීම් ලිපියක් දැන්වීමේ සඳහන් ෆැක්ස් අංකය වෙත යොමු කිරීමට කටයුතු කළ යුතු ය.

4.2 එහිදී විභාග දෙපාර්තමේන්තුව විසින් ඉල්ලා සිටින අවශ්‍ය කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා ඔබ ළඟ තබාගත් සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රයේ පිටපත, විභාග ගාස්තු ගෙවීමට අදාළ වේ නම් ලදුපතෙහි පිටපත හා ඉල්ලුම් පත්‍රය තැපැල් කිරීමේ දී ලියාපදිංචි කරන ලද කුවිතාන්සිය තබා ගත යුතු ය.

05. **අනන්‍යතාව :**
අපේක්ෂකයන් විභාග ශාලාව තුළ දී තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහාම විභාග ශාලාධිපතිට ස්වකීය අනන්‍යතාව ඔප්පු කළ යුතුය. ඒ සඳහා පහත සඳහන් ලියකියවිලි වලින් එකක් විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය.

(i) පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මඟින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත,
(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය.

06. **විභාග ගාස්තු :**
පළමුවරට මෙම විභාගයට පෙනී සිටින නිලධාරීන් විසින් කිසිඳු විභාග ගාස්තුවක් ගෙවිය යුතු නොවේ.එසේකුදු වුවත් ඉන්පසු වාරවල දී නිලධාරීන් විසින් එක්වර සම්පූර්ණ විභාගයට හෝ විෂයයන් එකකට වඩා වැඩි සංඛ්‍යාවකට පෙනී සිටින්නේ නම් රු. 1000.00 ක් ද, එක් විෂයයක් සඳහා පමණක් පෙනී සිටින්නේ නම් රු. 500.00 ක් ද, විභාග ගාස්තු වශයෙන් ගෙවිය යුතු අතර අදාළ විභාග ගාස්තුව අයදුම්පත්‍ර භාර ගන්නා අවසාන දිනට පෙර විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ අංක 2003-02-13 ට බැරවන ලෙස දිවයිනේ පිහිටි ඕනෑම තැපැල් /උපතැපැල් කාර්යාලයකට ගෙවා ලබා ගන්නා ලදුපත ඉල්ලුම් පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැලවෙන සේ අලවන්න. මොනම කරුණක් යටතේ වුවද මෙම ගාස්තුව ආපසු ගෙවනු නොලැබේ. මෙම විභාගය සඳහා ගෙවනු ලබන ගාස්තුව වෙනත් කිසිඳු විභාගයකට මාරු කිරීමට ඉඩදෙනු නොලැබේ.

07. මෙම විභාගය විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන අතර, ඔහු විසින් විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් නියම කරන ලද නීතිරීති වලට විභාග අපේක්ෂකයන් යටත් කෙරේ. මෙම ගැසට් පත්‍රයේ 1 වන කොටස (11 අ) ජේදය ආරම්භයේ පළ කරනු ලැබ ඇති විභාග අපේක්ෂකයන් සඳහා නීතිරීති මේ විභාගය සඳහා ද බල පැවැත්වේ. විභාගය ආරම්භ වන දිනයේ විභාග ශාලාධිපති වෙත තම අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කළ යුතුය. තම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන අපේක්ෂකයෙකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

08. මෙම විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ඇති සහ විභාග කොමසාරිස් ජනරාල් විසින් ප්‍රවේශ පත්‍රයක් නිකුත් කර ඇති තමන්ගේ දෙපාර්තමේන්තු/කාර්යාලවල නිලධාරීන්ට විභාගයට පෙනී සිටීම සඳහා දෙපාර්තමේන්තු/කාර්යාල ප්‍රධානීන් විසින් රාජකාරි නිවාඩු ලබා දිය යුතුය. ඉල්ලුම්පත්‍ර යොමු කළ සියලුම අයදුම්කරුවන් වෙත විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය.

09. මෙම රෙගුලාසිවලට අඩංගු නොවූ යම් කරුණක් වෙතොත් රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ ලේකම්ගේ අභිමතය පරිදි ඒ ගැන ක්‍රියා කරනු ඇත.

10. පළමුවන සහ දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය සඳහා අදාළ වන විෂය නිර්දේශයන් පහත දක්වා ඇත.

**ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ III වන ශ්‍රේණියේ නිලධාරීන් සඳහා පැවැත්වෙන පළමුවන කාර්යක්ෂමතා කඩඉම් විභාගයේ විෂය නිර්දේශය**

01. පළමුවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය පහත සඳහන් විෂයයන්ගෙන් සමන්විත වනු ඇත

| *විෂය අංකය* | *විෂයය* | *කාලය (පැය)* | *මුළු ලකුණු* | *සමාර්ථය සඳහා අවම ලකුණු* |
|---|---|---|---|---|
| 01 | ක්‍රමසම්පාදන සංකල්ප සහ විධි ශාස්ත්‍රය, ක්‍රමසම්පාදන ආයතන | 03 | 100 | 40 |
| 02 | ආර්ථික විශ්ලේෂණය හා සංඛ්‍යානය | 03 | 100 | 40 |
| 03 | ව්‍යාපෘති සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම, පසුවිපරම් කිරීම හා ඇගයීම | 03 | 100 | 40 |
| 04 | ආයතන රෙගුලාසි සහ රාජ්‍ය අංශයේ මූල්‍යක්‍රම | 03 | 100 | 40 |
| 05 | ඉංග්‍රීසි භාෂාව | 03 | 100 | 40 |

02. සේවා ව්‍යවස්ථාවේ හා පත්වීම් ලිපියේ විධිවිධාන පරිදි නියමිත කාල සීමාව තුළ හෝ ඊට පෙර විභාගය සමත් විය යුතු අතර, සියලුම විෂයයන් සඳහා එකම වාරයකදී හෝ වෙන් වෙන් වශයෙන් වාර කීපයකදී හෝ පෙනී සිටීමට නිලධාරියෙකුට අවසර ඇත.

03. ප්‍රශ්න පත්‍රයක ඇති සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සැපයීම අනිවාර්ය වේ.

**විභාග පරිපාටිය**

*විෂය අංකය 01 - ක්‍රමසම්පාදන සංකල්ප සහ විධි ශාස්ත්‍රය, ක්‍රමසම්පාදන ආයතන*

(i) ජාතික පරමාර්ථ හා ප්‍රමුඛතා සහ ඒවා සාක්ෂාත් කර ගැනීම සඳහා ක්‍රමසම්පාදන ප්‍රතිපත්ති රාමුව සහ වැඩසටහන්
(ii) ජාතික ක්‍රමසම්පාදන සඳහා විධි ශාස්ත්‍රය ක්‍රමසම්පාදනයෙහිලා ප්‍රධාන ගැටලු තැන්, පොදු ජන සහභාගිත්වය, සම්පත් යෙදවීම ආදිය
(iii) ජාතික ක්‍රමසම්පාදන සඳහා දත්ත ස්වභාවය සහ මූලාශ්‍ර, දත්ත රැස්කිරීම, අර්ථ නිරූපණය ඉදිරිපත් කිරීම සහ විශ්ලේෂණය, ක්ෂේත්‍ර අධීක්ෂණ හා විමර්ශන ජන විකාශනය සංකල්ප, ආර්ථික විද්‍යා ප්‍රක්ෂේපණ හා ප්‍රතිපත්ති විශ්ලේෂණ

*විෂය අංකය 02 - ආර්ථික විශ්ලේෂණය හා සංඛ්‍යානය*

(i) නිපැයුම හා බෙදා හැරීම පිළිබඳ න්‍යායයන් කෙරෙහි විශේෂ සැලකිල්ලකින් යුතුව ආර්ථික විද්‍යා මූලධර්ම
(ii) මුදල්, බැංකු ක්‍රම, ජාත්‍යන්තර මූල්‍ය ක්‍රම හා වෙළදාම
(iii) මූල්‍ය, මුදල්,වෙළඳ හා තීරුබදු ප්‍රතිපත්ති විශ්ලේෂණය
(iv) ශ්‍රී ලංකාවේ ආර්ථික ව්‍යුහය
(v) ආර්ථික, විද්‍යාත්මක සහ සමාජයීය සිද්ධි
(vi) ආර්ථික විශ්ලේෂණය සහ ක්‍රමසම්පාදනයෙහිලා උපයෝගි කර ගන්නා මූලික සංඛ්‍යාන සංකල්ප හා ක්‍රම
(vii) ප්‍රතිලාභ/ පිරිවැය විශ්ලේෂණ මූලධර්ම

*විෂය අංකය 03 - ව්‍යාපෘති සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම, පසුවිපරම් කිරීම හා ඇගයීම*

(i) ව්‍යාපෘති සැලසුම් කිරීම, හඳුනා ගැනීම සහ නිර්වචනය කිරීම හා ව්‍යාපෘති සම්පාදනය, ප්‍රතිපත්ති, සිද්ධාන්ත, ස්ථානය තෝරා ගැනීම, තාක්ෂණය සහ පිරිවැය සහ ප්‍රතිලාභ ඇස්තමේන්තු කිරීම, තාක්ෂණික මූල්‍ය සහ ආර්ථික විශ්ලේෂණය

(ii) ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ මෙහෙයවීම/අධීක්ෂණය, ව්‍යාපෘති සහ වැඩසටහන් නිසියාකාරව සහ කාලීනව ක්‍රියාත්මක කිරීම, සවිස්තරාත්මක ක්‍රියාකාරි සැලසුම් හා ක්‍රියාත්මක කිරීමේ උපලේඛන සැකසීම, පසුවිපරම් සහ ප්‍රගති පාලනය සම්බන්ධීකරණය සහ ඉදිරි කටයුතු.

(iii) ව්‍යාපෘති ඇගයීම, ව්‍යාපෘතිවල සහ වැඩසටහන්වල සාකල්‍යය තක්සේරු කිරීම, පිරිවැයට සාපෙක්ෂව ප්‍රතිලාභ විශ්ලේෂණය

*විෂය අංකය 04 - ආයතන රෙගුලාසි සහ රාජ්‍ය අංශයේ මූල්‍ය ක්‍රම*

(i) ආණ්ඩුවේ මුදල් රෙගුලාසි 1 වැනි කාණ්ඩය (x වන පරිච්ඡේදය හැර)

(ii) ආයතන සංග්‍රහයේ පරිච්ඡේද VII, IX, XI, XII, XV, XXIII, XXV, XXVI, XXVII, XXVIII, XXIX, XXX, XXXI, XXXII, XXXIII, XLVII, XLVIII රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති පළමුවන කාණ්ඩයේ I සිට VI දක්වා පරිච්ඡේද

(iii) ශ්‍රී ලංකාවේ මූල්‍ය පාලනය :- රාජ්‍ය කළමනාකරණයට අදාළ ව්‍යවස්ථාමය විධිවිධාන, රාජ්‍ය මූල්‍ය සම්බන්ධ පාර්ලිමේන්තුවේ පාලනය, ඒකාබද්ධ අරමුදල සහ එහි ක්‍රියාකාරීත්වය, විසර්ජනයේ අරමුණ හා විසර්ජන ක්‍රම, රාජ්‍ය ආදායම්, මුදල් ඇමතිවරයාගේ බලතල හා කාර්යභාරය, භාණ්ඩාගාරයේ බලතල හා කාර්යභාරය, වෙරන්ට් සහ අග්‍රිම අධිකාරිය, විගණකාධිපති, ඔහුගේ බලතල හා කාර්යභාරය, රාජ්‍ය ව්‍යාපාර කමිටුව.

(iv) ගිණුම් නිලධාරීන්, ප්‍රධාන ගිණුම් නිලධාරීන් හා රාජ්‍ය ආදායම් පිළිබඳ ගිණුම් නිලධාරීන් පත් කිරීම, ඔවුන්ගේ බලතල හා කාර්යභාරය

(v) රාජ්‍ය වියදම් සැලසුම් කිරීම හා කළමනාකරණ , සංවිධානවල අරමුණු හා කාර්යභාරයන් හඳුනා ගැනීම, වාර්ෂික ආදායම් හා ඇස්තමේන්තු සැකසීම හා අවසන් තීරණ ගැනීම, අනුමත වියදම් ඇස්තමේන්තුවල වෙනස්කම් කිරීම, වීරමොං පරිපාටිය ක්‍රියාත්මක කිරීම, රාජ්‍ය අංශයේ සේවක සංඛ්‍යා කළමනාකරණය, පරිපූරක ඇස්තමේන්තු

(vi) රජයේ ප්‍රසම්පාදන ක්‍රියාපටිපාටිය :- භාණ්ඩ, සේවා හා වැඩ ලබා ගැනීම, ප්‍රසම්පාදන කමිටු හා තාක්ෂණ ඇගයීම් කමිටුවල සංයුතිය, පත්කිරීම්, බලතල හා කාර්යභාරය, ලංසු ඇගයීමේ ක්‍රියා පටිපාටිය, විදේශ ආධාර මත ක්‍රියාත්මක වන ව්‍යාපෘතිවල කළමනාකරණය

*විෂය අංකය 05 - ඉංග්‍රීසි භාෂාව*

ක්‍රමසම්පාදනය, සංවර්ධනය, සැලසුම්කරණය සහ කළමනාකරණය යන විෂයන්ට අදාළව අපේක්ෂකයින්ගේ අධ්‍යාපනික හා වෘත්තිය ඉංග්‍රීසි භාෂා කුසලතාව මැනීම සඳහා ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ලිඛිත පරීක්ෂණයක් පවත්වනු ලැබේ.

ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ 111 වැනි ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගයේ විෂය නිර්දේශය

01. දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය පහත සඳහන් විෂයන්ගෙන් සමන්විත වනු ඇත :—

| විෂය අංකය | විෂයය | කාලය (පැය) | මුළු ලකුණු | සාමාන්‍ය |
|---|---|---|---|---|
| 06 | සංවර්ධන සැලසුම් ශිල්ප ක්‍රම | 03 | 100 | 40 |
| 07 | මූලික සාර්ව ආර්ථික විද්‍යාව | 03 | 100 | 40 |
| 08 | වර්තමාන ජාත්‍යන්තර ආර්ථික හා දේශපාලන අර්බුද හා ඒවායින් ශ්‍රී ලංකා ආර්ථිකයට සිදුවන බලපෑම | 03 | 100 | 40 |

02. සේවා ව්‍යවස්ථාවේ හා පත්වීම් ලිපියේ විධිවිධාන පරිදි නියමිත කාල සීමාව තුල හෝ ඊට පෙර විභාගය සමත් විය යුතු අතර, සියලුම විෂයයන් සඳහා එකම වාරයකදී හෝ වෙන් වෙන් වශයෙන් වාර කීපයකදී හෝ පෙනී සිටීමට නිලධාරියෙකුට අවසර ඇත.

03. ප්‍රශ්න පත්‍රයක ඇති සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම අනිවාර්ය වේ.

විභාග පරිපාටිය ඃ

(i) සංවර්ධන සැලසුම් ශිල්ප ක්‍රම

(i) ස්වොට් විශ්ලේෂණය (SWOT)
(ii) ගැටලු වෘක්ෂය
(iii) තර්ක රාමු විශ්ලේෂණය
(iv) පිලි ලදුව ක්‍රමවේදය
(v) ශුද්ධ වර්තමාන අගය
(vi) අභ්‍යන්තර ඵලදා අනුපාතය
(vii) ඡායා මිල යොදා ගැනීම

(ii) මූලික සාර්ව ආර්ථික විද්‍යාව

(i) ජාතික ගිණුම
(ii) ආර්ථික වර්ධන වේගය
(iii) සමතුලිත ජාතික ආදායම
(iv) ගුණිත ප්‍රතිවිපාතය
(v) උද්ධමනය
(vi) පොලී අනුපාතය
(vii) රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති පිළිබඳ හැඳින්වීමක්
(viii) මූල්‍ය ප්‍රතිපත්ති පිළිබඳ හැඳින්වීමක්
(ix) වෙළඳ චක්‍ර

(iii) වර්තමාන ජාත්‍යන්තර ආර්ථික අර්බුද හා ඒවායින් ශ්‍රී ලංකා ආර්ථිකයට සිදුවන බලපෑම

වර්තමාන ජාත්‍යන්තර ආර්ථික අර්බුද හා ඒවායින් ශ්‍රී ලංකා ආර්ථිකයට සිදුවන බලපෑම (ඒ ඒ අවස්ථාවේ ඇති වන ලෝක ආර්ථික තත්ත්වයන්ට කාලීනව ගැළපෙන මාතෘකා අදාළව පිළිතුරු සැපයීමට සිදුවේ.)

මෙහි සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් පළවන නිවේදනවල පාඨ අතර කිසියම් නොගැලපීමක් හෝ අනනුකූලතාවක් වේනම් එවැනි විටෙකදී සිංහල භාෂාවෙන් පළවන නිවේදනය බලාත්මක වේ.

ජේ. දඩල්ලගේ,
ලේකම්,
රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය.

2015 ඔක්තෝබර් මස 23 වැනි දින,
රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය,
කොළඹ 07.

අයදුම්පත්‍රය

ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ 111 වන ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන පළමුවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2015

FIRST EFFICIENCY BAR EXAMINATION FOR OFFICERS IN GRADE III OF THE SRI LANKA PLANNING SERVICE - 2015

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා)

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍ය :
(අදාළ අංකය කොටුව තුළ ලියන්න.)
සිංහල - 2
දෙමළ - 3 (ඉල්ලුම් කළ මාධ්‍ය පසුව වෙනස් කිරීමට
ඉංග්‍රීසි - 4 ඉඩ දෙනු නොලැබේ.)

01. නම :
1.1 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
(උදා : HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDHANA)

1.2 අගට යෙදෙන නම මුලින්ද අනෙකුත් නම්වල මුලකුරු පසුව ද යොදා නම :
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
(උදා : GUNAWARDHANA H.M.S.K. )
1.3 සම්පූර්ණ නම (සිංහලෙන්/ දෙමළෙන්) :————.

02.
2.1 කාර්යාලීය ලිපිනය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
2.2 කාර්යාලීය ලිපිනය :————.
(සිංහලෙන්/ දෙමළෙන්)
2.3 ප්‍රවේශ පත්‍ර එවිය යුතු ලිපිනය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

03. 3.1 ස්ත්‍රී /පුරුෂ භාවය ස්ත්‍රී - 1 (අදාළ අංකය කොටුව තුළ ලියන්න.)
පුරුෂ - 0

3.2 ජාතික හැඳුනුම්පත් අංකය :

3.3 උපන් දිනය : වර්ෂය මාසය දිනය

3.4 ඉල්ලුම් පත්‍ර භාර ගන්නා අවසාන දිනට වයස : අවුරුදු මාස දින

04. ගැසට් නිවේදනයේ 10 වන ඡේදය යටතේ ඉදිරිපත් වන විෂයයන් :

4.1 පළමු කාර්යක්ෂමතා කඩඉම

| විෂයය | විෂය අංකය |
|---|---|
| ……………………… | |
| ……………………… | |
| ……………………… | |
| ……………………… | |
| ……………………… | |

05. ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ III වන ශ්‍රේණියට ඇතුළත් වූ දිනය :————.
( නිත්‍ය වශයෙන් රාජකාරි භාරගත් දිනය සඳහන් කළ යුතුය.)

06. රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය පරමාර්ථයන් සඳහන් ආදී ප්‍රවේශකයෙක් ද? නැතහොත් නව ප්‍රවේශකයෙක්ද ? :—————.

07. දෙපාර්තමේන්තුවේ නම (ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක් නම් එම කාර්යාලයේ නම) :—————.

08. පරීක්ෂණයට පෙනී සිටින්නේ ප්‍රථම වතාවට ද? :—————.

09. පරීක්ෂණයට පෙනී සිටින්නේ ප්‍රථම වතාවට නොවේ නම් ගෙවන ලද විභාග ගාස්තු :—————.

ලදුපත නොගැලවෙන සේ එහි එක් දාරයක් මගින් හොඳින් අලවන්න.
(ලදුපතේ ඡායා පිටපතක් ළග තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.)

10. ඉහත සඳහන් විස්තර නිවැරදි බව ද, ඉහත දක්වා ඇති භාෂා මාධ්‍යයෙන් විභාගයට පෙනී සිටීමට මට හිමිකම ඇති බව ද ප්‍රකාශ කරමි. තවද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් ගනු ලබන තීරණ වලට මම එකඟ වෙමි.

—————,
අපේක්ෂකයාගේ/අපේක්ෂිකාවගේ අත්සන.

දිනය :—————.

*සටහන.*—තමාගේ දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ හෝ දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙනුවට අත්සන් කිරීමට බලය ලත් නිලධාරියකුගේ, තමාගේ ප්‍රාදේශීය ප්‍රධානියාගේ ඉදිරිපිට දී අයදුම්කරුවන් අත්සන් කළ යුතුය.

*අත්සන සහතික කිරීම*

මාගේ කාර්යාලයේ නිලධාරියකු/නිලධාරිණියක වූ, මා පෞද්ගලිකව දන්නා හඳුනන ............................. මහතා/මහත්මිය/මෙනවිය .............. වැනි දින මා ඉදිරිපිට දී අත්සන් කළ බව මෙයින් සහතික කරමි.

නම :—————.
තනතුර :—————.
ලිපිනය :—————.
දිනය :—————.

—————,
සහතික කරන්නාගේ අත්සන.
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)

**දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය**

(i) ඉහත සපයා ඇති විස්තර පරීක්ෂා කර බැලූ බවත්, ඒවා නිවැරදි බවත්,

(ii) අපේක්ෂකයා/ අපේක්ෂිකාව මෙම විභාගයට පෙනී සිටීමට සුදුසු බවත් සහතික කරමි.

—————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.
(නිල මුද්‍රාව තැබිය යුතුය.)

තනතුර :—————.
දිනය :—————.

අයදුම්පත්‍රය

ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ III වන ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2015

SECOND EFFICIENCY BAR EXAMINATION FOR OFFICERS IN GRADE III OF THE SRI LANKA PLANNING SERVICE - 2015

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා)

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍ය
(අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

සිංහල - 2
දෙමළ - 3 (ඉල්ලුම් කළ මාධ්‍ය පසුව වෙනස් කිරීමට
ඉංග්‍රීසි - 4 ඉඩ දෙනු නොලැබේ.)

01. නම :
1.1 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :—————.
(උදා : HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDHANA)

1.2 අගට යෙදෙන නම මුලින්ද අනෙකුත් නම්වල මුලකුරු පසුව ද යොදා නම :
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
(උදා : GUNAWARDHANA. H. M.S. K )

1.3 සම්පූර්ණ නම (සිංහලෙන්/ දෙමළෙන්) :————.

02.

2.1 කාර්යාලයීය ලිපිනය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

2.2 කාර්යාලයීය ලිපිනය :————.
(සිංහලෙන්/ දෙමළෙන්)

2.3 ප්‍රවේශ පත්‍ර එවිය යුතු ලිපිනය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

03. 3.1 ස්ත්‍රී /පුරුෂ භාවය ස්ත්‍රී - 1
පුරුෂ - 0 ☐ (අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

3.2 ජාතික හැඳුනුම්පත් අංකය : ☐☐☐☐☐☐☐☐☐☐

3.3 උපන් දිනය : වර්ෂය ☐☐ මාසය ☐☐ දිනය ☐☐

3.4 ඉල්ලුම් පත්‍ර භාර ගන්නා අවසාන දිනට වයස : අවුරුදු ☐☐ මාස ☐☐ දින ☐☐

04. ගැසට් නිවේදනයේ 10 වන ඡේදය යටතේ ඉදිරිපත් වන විෂයයන් :

4.1 දෙවන කාර්යක්ෂමතා කඩඉම

| විෂයය | විෂයය අංකය |
|---|---|
| ……………………… | ☐ |
| ……………………… | ☐ |
| ……………………… | ☐ |

05. ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ III වන ශ්‍රේණියට ඇතුළත් වූ දිනය :————.
(නිත්‍ය වශයෙන් රාජකාරි භාරගත් දිනය සඳහන් කළ යුතුය.)

06. රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය පරමාර්ථයන් සඳහන් ආදී ප්‍රවේශකයෙක් ද? නැතහොත් නව ප්‍රවේශකයෙක්ද ? :————.

07. දෙපාර්තමේන්තුවේ නම (ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක් නම් එම කාර්යාලයේ නම) :————.

08. පරීක්ෂණයට පෙනී සිටින්නේ ප්‍රථම වතාවට ද? :————.

09. පරීක්ෂණයට පෙනී සිටින්නේ ප්‍රථම වතාවට නොවේ නම් ගෙවන ලද විභාග ගාස්තු :————.

| |
|---|
| ලදුපත නොගැලවෙන සේ එහි එක් දරයක් මගින් හොඳින් අලවන්න. |
| (ලදුපතේ ඡායා පිටපතක් ළග තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.) |

10. ඉහත සඳහන් විස්තර නිවැරදි බව ද, ඉහත දක්වා ඇති භාෂා මාධ්‍යයෙන් විභාගයට පෙනී සිටීමට මට හිමිකම ඇති බව ද ප්‍රකාශ කරමි. තව ද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් ගනු ලබන තීරණවලට මම එකඟ වෙමි.

————,
අපේක්ෂකයාගේ/අපේක්ෂිකාවගේ අත්සන.

දිනය :————.

*සටහන.*—තමාගේ දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ හෝ දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙනුවට අත්සන් කිරීමට බලයලත් නිලධාරියකුගේ, තමාගේ ප්‍රාදේශීය ප්‍රධානියාගේ ඉදිරිපිටදී අයදුම්කරුවන් අත්සන් කළ යුතු ය.

*අත්සන සහතික කිරීම :*

මාගේ කාර්යාලයේ නිලධාරියකු/නිලධාරිණියක වූ, මා පෞද්ගලිකව දන්නා හඳුනන .............................. මහතා/මහත්මිය/මෙනවිය ............... වැනි දින මා ඉදිරිපිට දී අත්සන් කළ බව මෙයින් සහතික කරමි.

නම :————.
තනතුර :————.
ලිපිනය :————.
දිනය :————.

————,
සහතික කරන්නාගේ අත්සන.
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න).

**දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය**

(i) ඉහත සපයා ඇති විස්තර පරීක්ෂා කර බැලූ බවත්, ඒවා නිවැරදි බවත්,

(ii) අපේක්ෂකයා/ අපේක්ෂිකාව මෙම විභාගයට පෙනී සිටීමට සුදුසු බවත් සහතික කරමි.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.
(නිල මුද්‍රාව තැබිය යුතු ය.)

තනතුර :————.
දිනය :————.

11-182

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන සංශෝධිත ගාස්තු

2013 ජනවාරි මස 01 වැනි දින සිට

(සෑම සිකුරාදා දිනයන්හි ගැසට් පත්‍රය පළ කරනු ලැබේ.)

***සියලුම ගැසට් පත්‍ර නියමිත දිනට www. documents. gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.***

1. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.
2. පෞද්ගලික පළකරන්නන්ගේ සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, බොරැල්ල, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලයාධිපතිට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට පුළුවන.
3. කාර්යාල වේලාවන් පෙරවරු 8.30 සිට පස්වරු 4.15 දක්වා වේ.
4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා බව සැලකිය යුතු යි.
5. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. දැන්වීම් සහ ප්‍රකාශනයන් තැපෑලෙන් එවන විට ඒ සමග ම අයවිය යුතු ගාස්තුව සඳහා මුදල් ඇනවුමක් හෝ චෙක් පතක් හෝ තැපැල් ඇනවුමක් රජයේ මුද්‍රණාලයාධිපතිට එවිය යුතු ය. මුදල් ඇණවුම් ගෙවන කාර්යාලය බොරැල්ල තැපැල් කාර්යාලය වේ.
6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පමණක් පැහැදිලි ව ටයිප් කර එවිය යුතු ය. **අත් අකුරින් ලියූ කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.**
7. සෑම අත්සනකට ම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතු යි.
8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් පළ කරනු නොලැබේ.
9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළා යයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රීම් උසාවියේ නීතිඥවරයකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.
10. **2013 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේ යි :-**

| | රු. ශ. |
|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... ... | 137 0 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට ... ... ... | 137 0 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට ... ... ... | 1,300 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට ... ... ... | 2,600 0 |

*(අඟලේ සෑම කොටසකට ම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)*

11. සෑම සිකුරාදා දිනකට ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.
12. සෑම මාසයක ම මුල් සතියේ *ගැසට් පත්‍රයේ* සෑම කොටසක ම කෙළවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර, සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපතිට ලැබෙන සේ එවිය යුතු යි.
13. *ගැසට් පත්‍රය* නොලැබීම, ප්‍රමාද වී ලැබීම සහ ලිපිනය වෙනස් කිරීම් ආදිය කොළඹ 08, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ, මුද්‍රණාලයාධිපතිට දැනුම් දිය යුතු ය.
14. **2013 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මකවන සංශෝධිත දායක ගාස්තුව :-**

### ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික දායක මුදල සහ තැපැල් ගාස්තුව)

| | *වාර්ෂික දායක මුදල* *රු. ශ.* | *තැපැල් ගාස්තුව* *රු. ශ.* |
|---|---|---|
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 4,160 0 | 9,340 0 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 580 0 | 950 0 |
| III වැනි ඡේදය (වෙළඳ ලකුණු සහ පේටන්ට් බලපත්‍ර ආදිය ) ... ... | 405 0 | 750 0 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව ) ... ... | 890 0 | 2,500 0 |
| II වැනි කොටස (අධිකරණ) ... ... ... ... ... ... ... ... | 860 0 | 450 0 |
| III වැනි කොටස (ඉඩම්) ... ... ... ... ... ... ... ... | 260 0 | 275 0 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... | 2,080 0 | 4,360 0 |
| V වැනි කොටස (මඟීන් ගෙන යෑමේ අවසර සහ පොත් නාමාවලිය) | 1,300 0 | 3,640 0 |
| VI වැනි කොටස (ජූරිසභිකයින්ගේ හා උපදේශකවරුන්ගේ නාමාවලිය)... ... | 780 0 | 1,250 0 |
| අති විශෙෂ ගැසට් පත්‍රය... ... ... ... ... ... ... ... | 5,145 0 | 5,520 0 |

(ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ දොලොස් මාසයකට නොඅඩු කාලසීමාවකට පමණ ය. )

### * තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)

| | **පිටපතක මිල** *රු. ශ.* | **තැපැල් ගාස්තුව** *රු. ශ.* |
|---|---|---|
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 40 00 | 60 0 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 25 00 | 60 0 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... ... | 15 00 | 60 0 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... | 80 0 | 120 0 |
| II වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 0 | 60 0 |
| III වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 0 | 60 0 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 23 0 | 60 0 |
| V වැනි කොටස ... ... ... ... ... ... ... ... | 123 0 | 60 0 |
| VI වැනි කොටස ... ... ... ... ... ... ... ... | 87 0 | 60 0 |

* කොළඹ 05, පොල්හේන්ගොඩ, කිරුළපන මාවතේ, අංක 163 හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් තනිපිටපත් මිල දී ගත හැක.

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවත් පහත පළ කර ඇති *උපලේඛනයේ* දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියලුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවා මෙන්ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

***සැළකිය යුතුයි.*** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | **2015** | | | | | |
| නොවැම්බර් | 2015.11.06 | සිකුරාදා | 2015.10.23 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2015.11.13 | සිකුරාදා | 2015.10.30 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2015.11.20 | සිකුරාදා | 2015.11.06 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2015.11.27 | සිකුරාදා | 2015.11.13 | සිකුරාදා | දහවල් | 12.00 |
| දෙසැම්බර් | 2015.12.04 | සිකුරාදා | 2015.11.20 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2015.12.11 | සිකුරාදා | 2015.11.27 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2015.12.18 | සිකුරාදා | 2015.12.04 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2015.12.23 | බදාදා | 2015.12.11 | සිකුරාදා | දහවල් | 12.00 |
| | **2016** | | | | | |
| ජනවාරි | 2016.01.01 | සිකුරාදා | 2016.12.18 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2016.01.08 | සිකුරාදා | 2016.12.23 | බදාද | දහවල් | 12.00 |
| | 2016.01.14 | බ්‍රහස්පතින්දා | 2016.01.01 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2016.01.22 | සිකුරාදා | 2016.01.08 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2016.01.29 | සිකුරාදා | 2016.01.14 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |

**ඩබ්ලිව්. ඒ. ඒ. ජී. ෆොන්සේකා,**
රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ. බ.).*

2015 ජනවාරි මස 22 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.